# මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශිය සභාව

## 2022 අප්‍රේල් 21 වන දින

❖ **08 වන සැසි වාරයේ 48 වන සභා වාර්තාව**

**දිනය :- 2022.04.21 වන දින**

**වේලාව :- පෙ.ව.10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය**

පැමිණීම

| | |
|---|---|
| 01. ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා. ස. ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් තුෂාර ගුරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාරි මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10.ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා | පෙ.ව. 10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඒ. සංජීව මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. කේ. රන්ජන් වීරසේකර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණී සංජීව | පෙ.ව. 10.00 |
| 20.ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය. | පෙ.ව. 10.00 |

21.ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ජී.සනත් චන්ද්‍ර කුමාර් පෙ.ව. 10.00

22. ගරු ප්‍රා.ස.ම. එන්.ජී.එස්. විරසිරි මැතිතුමිය. පෙ.ව. 10.00

**<u>නොපැමිණීම</u>**

01. ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය.

02. ගරු ප්‍රා.ස.ම. ඩයි.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.

03. ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා.

04. ගරු ප්‍රා.ස.ම. ඊ.බී. ඉන්දික මැතිතුමා.

05. ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා.

06. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය

07. ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

01. ලේකම (වැ.බ) - එම්.දිනුජිත් රන්දුල මයා.

02. කළමනාකරණ සේවා නිලධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

**<u>ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණී සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගී වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදැසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කවුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ අප්‍රේල් මස මහ සභා රැස්වීම සඳහා සහභාගී වූ ගරු උප සභාපතිතුමා, හිටපු සභාපතිතුමන්ලා , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගී වූ ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියන්, මාධ්‍යවේදී තුමන්ලාත් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**<u>01.පසුගිය සභා රැස්වීම වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.</u>**

2022 මාර්තු මස 24 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියවූවා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

සියලු දෙනාටම සුභ උදෑසනක්. මෙම පසුගිය සභා වාර්තාවේ 07 වන පිටුවේ යෝජනා අංක 05- 03 යටතේ කිරම බස් නැවතුම්පොළ කඩ කාමර සම්බන්ධව කථා කළා. එහිදී පුවත්පත් විකිනීම සඳහා වෙන් කර ඇති ස්ථානය ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බැවින් ඒ සඳහා ඉඩකඩ ඇති කඩ කාමරයක් ලබා දීමට ඔබතුමා එකගතාවය පළ කළා. නමුත් වාර්තාවේ ඒ බවක් සඳහන් වෙන්නේ නැහැ. මෙය අපි ගිය සභාවේ සාකච්ඡා කර තීරණයකට එළඹි බැවින් එය සභා වාර්තාවේ පැහැදිලිව තිබියි යුතුයි. නමුත් මෙහි එම පුවත්පත් කියවන ස්ථානයට ඉඩකඩ ඇති කඩ කාමරයක් ලබා දෙන බව සඳහන් වෙන්නෙ නැහැ. මේ සම්බන්ධව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි සියලු දෙනා අදහස් දැක්වූවා. අවසානයේ ගරු සභාපතිතුමා එලෙස කඩ කාමරයක් ලබා දීමට හෝ ඉඩකඩ ඇති ස්ථානයක සකස් කර දෙන බවට එකගතාවය පළ කළා. ඒක සභා වාර්තාව තුළ පැහැදිලිව සටහන් නොවන්නේ කුමන හේතුවකින්ද කියන එක ගැටළුවක්. කෙසේ නමුත් ඒ සඳහා ලබා දෙන තීරණය පැහැදිලිව කර ඉදිරිපත් කළ යුතුයි. එය සංශෝධනය කර වාර්තාවට ඇතුලත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒත් එක්කම 27 වන පිටුවේ අංක 08-01 යටතේ කටුවන ප්‍රාදේශිය සභාව සතු වාහන සඳහා අවශ්‍ය ටයර් නැවත පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම මැයෙන් යෝජනාවක් කරලා තිබුණා .එහිදී භාවිතා කරන ලද ටයර් නැවත පිරවීම හෝ නැවත පුවරවන ලද ටයර් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන්න කියන ඉල්ලීම අපි අනුමත කළා. ඒ සමගම මම ඒ සඳහා යෝජනාවක් එක් කළා. සභාවට එවැනි ස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ව්‍යාපෘති යෝජනාවක් සකස් කර අවශ්‍ය කටයුතු සිදු කරන්න කියලා. ඒත් එක්කම සභාවට අවශ්‍ය තෙප්කැගේ මැෂින් දෙකක් මිලදී ගන්න මම යෝජනා කළා. ඒ සඳහා ඔබතුමා එකගතාවය පල කළා. නමුත් මෙම වාර්තාවේ එය ස්ථිර වුණ බවක් සඳහන් වෙන්නෙ නැහැ. අපි යෝජනාවක් ඉදිරිපත් කළාම එය ඉටු කළා හෝ නොකළා එය විධිමත්ව යෝජනා ස්ථිරත්වයෙන් යුතුව ඇතුලත් කල යුතුයි. ඒ සංශෝධනයත් සිදු කරන්න.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මෙම දෝෂ හිතාමනා ඇති කළ දෝෂ නොවෙයි, මෙම වාර්තාවේ කිසිදු කරුණක් අපි ඉවත් කරලා නැහැ. අපි සංශෝධන විදියට ඒ සියල්ල ඇතුලත් කරමු.

ඒ අනුව කිරම පොළ කඩ කාමර හිමියන් වෙන බස් නැවතුම් පොළ බිම් මහලේ කඩ කාමර ලබා දීම සම්බන්ධව කමිටු තීරණයන් මගින් තෝරා ගන්නා ලද අය සඳහා එම කඩ කාමර ගිවිසුම් ගත වී ලබා දීම සුදුසු බවත් ඉතිරි අයට නව කඩ කාමර සභා අරමුදලින් සකස් කර දීම සම්බන්ධවත් දැනට එන්.ඒ ස්වර්ණා යන අයට වෙන් කරන ලද කඩ කාමරය ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් ඉඩ පහසුකම් සහිත කඩ කාරමයක් ලබා දීම හෝ ඉඩ පහසුකම් සහිත වෙනත් ස්ථානයක් සොයා බලා සභා අරමුදලින් කඩ කාමරයක් සකස් කර දීම සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකහතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

එසේම ප්‍රාදේශිය සභාවේ වාහන සඳහා අවශ්‍ය ටයර් මිලදී ගැනීමේදී භාවිතා කරන ලද ටයර් නැවත පිරවීමට හෝ නැවත පුරවන ලද ටයර් මිලදී ගැනීම සම්බන්ධවත් ඒ සඳහා ටයර් නැවත පිරවීමේ ස්ථානයක් සභාව මගින් ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘතියක් සකස් කිරීම සම්බන්ධවත් සභාවට අවශ්‍ය තෙප්කැගේ මැෂින් දෙකක් සැපයුම් ආයතන මගින් මිල කැඳවීම කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධවත් විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකහතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු ප්‍රා.ස.ම.සුගත් සරඹගේ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, ගමට පසුගිය සභා වාර්තාවේ කිරම බස් නැවතුම්පොළ කඩ කාමර සම්බන්ධව කථා කිරීමේදී මමත් යම් අදහසක් ඉදිරිපත් කළා. නමුත් එය මෙහි සඳහන් වෙන්නේ නැහැ. එය නැවත සංශෝධනය සිදු කළ යුතු නැහැ. නමුත් මගේ අදහස මෙහි සඳහන් නොවන බව කිව යුතුයි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

නිහඩතාවයෙන් පෙනී යන්නේ පසුගිය සභා වාර්තාවේ තව දුරටත් සංශෝදන නොමැති බවයි. ඒ අනුව සංශෝදන සහිත වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මාර්තු මස [illegible] වන දින පැවති මහ සභා රැස්වීමේ සංශෝදිත [illegible]තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 02. <u>ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

විශේෂ නිවේදන යටතේ සියලු දෙනාම දැනුවත් කළ යුතු කාරණයක් තියෙනවා. 2022.03.31 දිනට සියලුම ප්‍රාදේශිය සභා සභික වරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පළාත් පාලන කොමසාරිස්තුමන්ගේ අත්සනින් යුතුව ලිපියක් එවා තිබෙනවා. ඒ නිසා සියලුම දෙනා වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීමට කටයුතු කරන්න කියලා ඉල්ලීම කරනවා.

## <u>03. ප්‍රාදේශිය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා</u>

## <u>සන්නිවේදන -</u> නැත

## <u>04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -</u> නැත

## <u>05. යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>

## <u>05 – 1. කොරෝනා වසංගතය හමුවේ සේවයට වාර්තා කළ නොහැකි වීම මත වැටුප් ලබා ගැනීම සම්බන්ධවයි.</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

කොරෝනා වසංගතය හමුවේ සේවයට වාර්තා කළ නොහැකි වීම මත වැටුප් ලබා ගැනීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 04 /වැටුප් විෂය හා 2021.03.31 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් හට නිරෝධායන කාල සීමාව තුළ 50% ක උපරිමයකට යටත්ව සභාව තීරණය කරන ලද මුදලක් ගෙවීමට ගරු ආණ්ඩුකාර තුමන්ගේ අනුමැතිය ලැබී ඇති බැවින් දැනට එම සේවකයින් හට මුළු වේතනයන් ගෙවීම් කර ඇති බැවින් ඒ සඳහා සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව මෙම සේවකයින් නිරෝධායන කාල සීමාව තුළ සේවා අවශ්‍යතාවය මත සේවයෙහි යොදවා ඇති

අතර, ඔවුන් වෙත නිරෝධායනය වූ කාලයන්ට අදාළව සම්පූර්ණ මුදල් දැනට ගෙවා ඇති බැවින් ඒ සඳහා සාධාරණයක් ඉටු කර දෙන ලෙස සේවක ඉල්ලීමද සමග ගරු ආණ්ඩුකාරතුමන් වෙත දන්වා යැවීම සුදුසු බව යෝජනා කරමි.

ගරු උප සභාපති එම්.ජයන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

ස්ථිර සේවකයින් හා නිලධාරීන් සඳහා මෙම කාලය තුළ වැටුප් ගෙව්වා. මේ අනියම් ආදේශක කොන්ත්‍රාත් සේවකයින් සඳහා වැඩ කරන දින සඳහා පමණයි වැටුප් ගෙවන්නේ. වැඩ කළ දින සඳහා අපි ඒ අයට වැටුප් ගෙවලා තියෙන්නේ. ඒ වැටුප් නැවත අය කර ගැනීම සාධාරණ නොවන බැවින් අපි ගරු ආණ්ඩුකාරතුමන් වෙත ඒ අය සඳහා සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලීමක් කර යවමු.

**<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>**

මේ සඳහා ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සභාව මගින් 50%ක උපරිමයකට යටත්ව යම් මුදලක් තීරණය කර එම වැටුප ගෙවන්න තමයි කියලා තියෙන්නේ. දැනට අපි ඒ අයට වැඩ කළ දින සඳහා ගෙවලා තියෙනවා. ඒ අයගෙන් නැවත අය කිරීම කරන්න අපහසුයි. ඒ අයගෙන් අපි වැඩ අරගෙන තියෙනවා. නමුත් මේ ලිපිවල සඳහන් වෙන්නේ සභාවේ තීරණයක් අරගෙන 50% ක උපරිමයකට යටත්ව ගෙවීම කරන්න කියලා. ලිපි මගින් ලබා දීලා තියන උපදෙස් ඒ ආකාරයෙන් වුවත් ඒ එක් එක් අයගේ ඉල්ලීම සමග ගරු ආණ්ඩුකාරතුමා වෙත යවලා සාධාරණයක් ලබා ගන්න පුළුවන් නම් ගැටළුවක් නැහැ.

**<u>ගරු ප්‍රා.ස.ම.එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මේ සේවකයින් සඳහා අදාළ ගෙවීම කරලා තියෙන්නේ ඒ අයගෙන් සේවාවන් ලබා ගෙන නිසා ඒ බව සාධාරණීකරණය කරලා අපි පළාත් පාලන සහකාර කොමසාරිස් තුමන් හරහා ගරු ආණ්ඩුකාරතුමන්ගෙන් ඉල්ලීමක් කරමු.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>**

ඔව්, දැනට අපි එහෙම ඉල්ලීමක් කරලා සාධාරණයක් ඉටු කරලා දෙන්න බලමු . ඒ සඳහා අනුමැතියක් නොදුන්නොත් අය කිරීම කරන්න වෙනවා. මුලින් අපි මේ සඳහා සාධාරණයක් කර දෙන ලෙස ඉල්ලීමක් කරමු. අපේ සෞඛ්‍ය අංශයෙහි හා ජල අංශයෙහි සේවකයින් මෙම කාල සීමාවන් තුළ රාජකාරී සිදුකළා. අපි වැඩ අතපසු කළේ නැහැ. කසළ එකතු කිරීම ආදිය සිදු කළා. ජල සැපයුම් අක්‍රමවත් වූ විට ඒවා සකස් කළා. ඒ නිසා ඒ අයට සාධාරණයක් ඉටු කරලා දෙන්න ඕන.

ඒ අනුව මෙම සේවකයින් නිරෝධායන කාල සීමාව තුළ සේවා අවශ්‍යතාවය මත සේවයෙහි යොදවා ඇති අතර, ඔවුන් වෙත නිරෝධායනය වූ කාලයන්ට අදාළව සේවය කළ දින සඳහා සම්පූර්ණ මුදල් දැනට ගෙවා ඇති බැවින් ඒ සඳහා සාධාරණයක් ඉටු කර දෙන ලෙස සේවක ඉල්ලීමද සමග ඒ බව ගරු ආණ්ඩුකාරතුමන් වෙත දන්වා යැවීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 2. ගබඩාව වෙත භාණ්ඩ මිලදී ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ගබඩාව සඳහා භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් ගබඩා භාරකරු විසින් 2022.03.30 වන දින ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ගබඩාව වෙත ඉල්ලුම් කර ඇති පහත භාණ්ඩ අදාළ සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

01. A4 පැකට -50
02. ජල මීටර් - 500
03. Hp Laser 107 Toner -10
04. කාඩ්බෝඩ් ෆයිල් කවර - 1000
05. කැල්කියුලේටර් - 10
06. 1" සුදු සෙලෝටේප් - 20
07. 2" බොන්ඩර් ටේප් - 15
08. ගම් බෝතල් ( මධ්‍යම ප්‍රමාණය) – 15
09. Canon LBP 214 dw - 01
10. 2" බයින්ඩර් ටේප් ( කළු) - 30

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ජී.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම.යූ.ජී.ධර්මසිරි මැතිතුමා**

ඉදිරියේදී ඇතැම් විට ලිපි ද්‍රව්‍ය ආදියෙහි හිඟයක් පැමිණේවි. ඒ නිසා අවශ්‍ය ද්‍රව්‍ය ඉක්මණින් මිලදී ගන්න

ඒ අනුව ගබඩාව වෙත ඉල්ලුම් කර ඇති භාණ්ඩ අදාළ සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 3. පෙර පාසල් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

පෙර පාසල් සඳහා අවශ්‍ය උපකරණ ඉල්ලීම මැයෙන් අංක කප්‍රාස 10 හා 2022.03.25 දින ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ගල්පොතුකන්ද හා කිරම පෙර පාසල් සඳහා ඉල්ලුම් කර ඇති පහත උපකරණ සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

| අනු අංකය | ද්‍රව්‍යය | පෙර පාසල |
|---|---|---|
| 01 | කැසට් යන්ත්‍ර 02 ( මයික් සමග) | කිරම / ගල්පොතුකන්ද |
| 02 | පොත් රාක්ක 02 | කිරම / ගල්පොතුකන්ද |
| 03 | යකඩ අල්මාරි 01 | ගල්පොතුකන්ද |
| 04 | ප්ලාස්ටික් ළමා පුටු 03 බැගින් | කිරම / ගල්පොතුකන්ද |
| 05 | ගුරු පුටු 02 | කිරම |

| | | |
|---|---|---|
| 06 | පිගන් 06 | කිරම |
| 07 | තැටිම 06 | කිරම |
| 08 | බෝල් 01 | කිරම |

ගරු ප්‍රා.ස.ම.එම්.පී.සී.නැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

මෙම භාණ්ඩ භාරදෙන ගමන්ම භාවිච්චි කරන ලද භාණ්ඩ ඇත්නම් රෙපෙයාර් කර වෙනත් ස්ථාන වලට දෙන්න පුළුවන්. ඒ නිසා ඒවා භාර ගන්න.

**ගරු ප්‍රා.ස.ම එම්.ඩී.සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මේ අවශ්‍ය ද්‍රව්‍ය පෙර පාසල් වලට ලබා දිය යුතුයි. නමුත් මේ දිනවල සහ පසුගිය කාලය තුළ කොවිඩ් තත්වය සහ මූල්‍ය අර්බුධය සමග අපි ඉතා අරපිරිමැස්මෙන් යුතුව අත්‍යවශ්‍ය කටයුතු සඳහා පමණක් වියදම් කළ යුතු වෙනවා. මේ දේවල් අරගෙන දීමට විරුද්ධත්වයක් නැහැ. නමුත් අපේ සභාවේ ආදායම් තත්වය අඩු වීම නිසා වියදම් සීමා කිරීම පිළිබඳ සිතන්න වෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මේ භාණ්ඩ අරගෙන දුන්නම ඒ අයගේ අවශ්‍යතාවයන් සඳහා ප්‍රයෝජනවත් වෙනවා. ඒ නිසා අරගෙන දෙමු. බොහෝ වියදම් අපි පාලනය කරලා තියෙන්නේ.

ඒ අනුව ගල්පොකුනන්ද හා කිරම පෙර පාසල් සඳහා ඉල්ලුම් කර ඇති උපකරණ සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 4. කටුවන පොදු වෙළඳපොළ ආපනශාලාවේ ජල බිල්පත සම්බන්ධවයි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන පොදු වෙළඳපොළ ආපනශාලාවේ ජල බිල්පත සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 06 හා 2022.04.08 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව පොදු වෙළඳපොළ නව පොළ භූමියට රැගෙන යාමත් සමග කටුවන පොදු වෙළඳපොළ ආපනශාලාව 2022 වර්ෂයට අදාලව ටෙන්ඩර් නොකරන ලද බැවින් මෙම ජල සම්බන්ධතාවය තාවකාලිකව විසන්ධි කිරීම යුදුසු බවටත් එහි ජල බිල්පත ආපන ශාලාව විවෘත නොකළ මාසයේ සිට සභාව විසින් ගෙවීම් කිරීම සුදුසු බවත් ඊට පෙර මාස වල හිග ඇත්නම් එය අදාළ බදුකරුගෙන් අයකර ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම.කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා**

ආපනශාලාව දැනට වසා තියෙනවා නම් අපි මේ ගාස්තුව ගෙවන්න ඕන. නමුත් මෙහි පසුගිය හිග ඇත්නම් ඒ කාලය තුළ ආපනශාලාව විවෘතව පැවති නිසා අය කර ගන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ අයගේ රැඳවුම් මුදලක් අප සතුව ඇත්නම ඒ මගින් හිග මුදල් කපා ගන්නත් පුළුවන්.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

ඒ සම්බන්ධව විෂය නිළධාරින්ට හොයලා බලන්න කියමු. මෙ සදහා දිගින් දිගටම බිල් ගෙවිමක් අවශ්‍ය නැහැ. එම ආපන ශාලව භාවිතා කරන්නේ නැත්නම් අපිට තාවකාලිකව ජල සැපයුම විසන්ධි කරන්න පුළුවන්.

ඒ අනුව කටුවන පොදු වෙළදපොළ ආපනශාලාවෙහි ජල සම්බන්ධතාවය තාවකාලිකව විසන්ධි කිරිම සුදුසු බවත් එහි ජල බිල්පත ආපන ශාලාව විවෘත නොකළ මාසයේ සිට සභාව විසින් ගෙවීම කිරිම සුදුසු බවත් ඊට පෙර මාස වල හිග ඇත්නම් එය අදාළ බදුකරුගෙන් අයකර ගැනීම සම්බන්ධවත් විවාධික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 5.නිළ ඇදුම් හා නිළ ඇදුම් දීමනාව ලබා දීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

නිළ ඇදුම් හා නිළ ඇදුම් දීමනාව හිමි සියලුම නිළධාරින් හා සේවකයින් වෙත නිල ඇදුම් හා නිල ඇදුම් දීමනාව ලබා දීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 16 හා 2022.04.08 දිනැතිව ඉදිරිපත් කරන ලද ලිපියට අනුව චක්‍ර ලේඛ ප්‍රකාරව නිළ ඇදුම් දීමනාව හිමි නිළධාරින් හා සේවකයින් සදහා නිළ ඇදුම් දීමනාව ලබා දීම සුදුසු බවත් නිළ ඇදුම හිමි නිළධාරින් හා සේවකයින් වෙත චක්‍රලේඛ ප්‍රකාරව අදාළ නිළ ඇදුම් සදහා මිල කැදවීම් කර එම නිළ ඇදුම් ලබා දීම සුදුසු බවත් ආධේශක හා අනියම් හා කොන්ත්‍රාත් සේවකයින්ටද ඒ ඒ තනතුරට අදාළව නිළ ඇදුම් ලබා දීම සුදුසු බවත් එම සියලු නිළධාරින්ට හා සේවකයින්ට අදාළ පරිදි නිළ ඇදුම් ඇදීම පිළිබද අවශ්‍ය දැනුවත් කිරිම සිදු කිරිම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ජේ.ජී.ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, නිළ ඇදුම් ලබා දීම සම්බන්ධව අපේ විරුද්ධත්වයක් නැහැ. ඒ සදහා අපි එකගයි. නමුත් නිළ ඇදුම දීමනාව හෝ නිළ ඇදුම් ලබා ගන්නා අය රාජකාරි කාලය තුළ එම නිළ ඇදුම් අදිනවා දකින්න නැහැ. සෞඛ්‍ය කම්කරුවන් පමණයි නිළ ඇදුම් අදිනවා පෙනෙන්නේ. අඩුම තරමෙ කාර්යාල දින වලදී වත් මෙ අයට නිළ ඇදුම් අදින්න නියම කරන්න ඕන. ඒ බව ලිඛිතව දැනුම දෙන්න ඕන.

<u>ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ඒ කථාවට මමත් එකග වෙනවා. මෙම සටහනට අනුව මාර්ග කම්කරුවන්ටත් සාරි නියම කරලා තියෙන්නේ. ඒ අයට සාරි සුදුසුද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

බව. පෙර වර්ෂ වලදීත් මේ පරිද්දෙන්ම තමයි නිල ඇඳුම් ලබා දීලා තියෙන්නේ. මේ අයගේ තනතුර මාර්ග කම්කරු වුවත් කාර්යාලය ඇතුළත සේවය කරන නිසා තමයි සාරි නියම කරලා තියෙන්නේ. සෞඛ්‍ය කම්කරු සේවයේ නිරත වන අයට තමයි කාකි ඇඳුම නියම කරලා තියෙන්නේ. ඇතුළේ අයට ඒ ඇඳුම සුදුසු නැති නිසා තමයි සාරි නියම කරලා තියෙන්නේ. කාකි ඇඳුම සඳහා වැය වන මුදල ඉක්මවා නොයන පරිදි මෙම සාරි ලබා දීම සිදු කරමු. අපි මේ නිලඇඳුම දීමනා ලබා දීලා සතියකට දින දෙකක් හෝ ඒවා අඳින්න කියලා කියමු.

<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

අපි නිල ඇඳුම් දීමනා ලබා දීමට විරුද්ධත්වයක් නැහැ. සිදු කරන රැකියාවේ පහසුව පිණිස මේ ඉල්ලුම් කරන විදියට නිල ඇඳුම් ලබා දීලා එය අඳින්නත් ඕන. ඒ බව දැනුවත් කරන්න.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඒත් එක්කම මීට පෙර වර්ෂ වල අපි ස්ථිර සේවකයින්ට පමණයි නිල ඇඳුම් දීමනා ලබා දුන්නේ. නමුත් මෙවර මේ සටහනට ඇතුළත් කරලා තියෙනවා ආදේශක, අනියම් හා කොන්ත්‍රාත් සේවකයින්ටත් අදාළ තනතුරට නියම නිළ ඇඳුම හෝ දීමනාව ලබා දීමට.

<u>ගරු ප්‍රා.ස.ම.කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

ඒක ගැටළුවක් නැහැ. එකම තනතුරක , එකම රාජකාරිය කරනවා නම් අපි ඒ අයටත් නිළ ඇඳුම් දෙන්න ඕන. ටික දෙනෙක් නිළ ඇඳුම් ඇඳගෙන ආදේශක අනියම් කියලා අනිත් අය වෙනත් ඇඳුමකින් ඉන්න ඕන නැහැ. අපි ඒ සියලු දෙනාටම නිළ ඇඳුම් දෙමු.

ඒ අනුව චක්‍රලේඛ ප්‍රකාරව නිළ ඇඳුම් දීමනාව හිමි නිළධාරීන් හා සේවකයින් සඳහා නිළ ඇඳුම් දීමනාව ලබා දීම සම්බන්ධවත් නිළ ඇඳුම හිමි නිළධාරීන් හා සේවකයින් වෙත චක්‍රලේඛ ප්‍රකාරව අදාළ නිළ ඇඳුම් සඳහා මිළ කැඳවීම් කර එම් නිළ ඇඳුම් ලබා දීම සම්බන්ධවත් ආදේශක, අනියම් හා කොන්ත්‍රාත් සේවකයින් සඳහාද ඒ ඒ තනතුරු වලට අදාළ නිළ ඇඳුම ලබා දීම සම්බන්ධවත් එම සියලු නිළධාරීන්ට හා සේවකයින්ට අදාළ පරිදි නිළ ඇඳුම් ඇඳීම පිළිබඳ අවශ්‍ය දැනුවත් කිරීම සිදු කිරීම සම්බන්ධවත් විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06. කාරක සභා වාර්තා</u>

### <u>06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.04.05 වන දින</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022.04.05 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 83 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම් කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | එම්.ඒ.ලලිත් නිශාන්ත මයා,බවුසර් රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4989.00 |
| 2. | කුමාර පලිහක්කාර මයා,බැකෝ රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 5896.00 |

| | | | |
|---|---|---|---|
| 3. | බී.ජී.සමන් කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 3637.00 |
| 4. | ජනක පුෂ්පකුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4294.00 |
| 5. | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 9346.00 |
| 6. | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 10461.00 |
| 7. | ඕ.ඔ.ඔ.ඩී.චමිල් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4506.00 |
| 8. | එස්.එන්.ජී.ගුණරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7623.00 |
| 9. | කේ.එච්.සේනාරත්න මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 8864.00 |
| 10. | ප්‍රභාත් ජනක සම්පත් මයා,ආදේශක කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7729.00 |
| 11. | දිමුතු සුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 13837.00 |
| 12. | එම්.පසිඳු උදාර මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 8397.00 |
| 13. | ඩබ්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 5299.00 |
| 14. | ජේ.එස්.චන්ද්‍රසිරි මයා,මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 11823.00 |
| 15. | කේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7165.00 |
| 16. | කේ.කේ.රාමචන්ද්‍ර මයා,ජල වැද්දුම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 3694.00 |
| 17. | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 12811.00 |
| 18. | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7145.00 |
| 19. | ඩබ්.පී.ආර්.ධර්මරාජිත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 16406.00 |
| 20. | ජී.එම්.නිහාල් චමින්ද මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 15684.00 |
| 21. | ඒ.කේ.ඒ.ක්‍රිෂාන්ත මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 12385.00 |
| 22. | කේ.වී.එම්.රුවිර ප්‍රියංකර මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7617.00 |
| 23. | ප්‍රියන්ත ඒකානායක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 6509.00 |

| | | | |
|---|---|---|---|
| 24. | ජී.සමීර මධුෂංක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4425.00 |
| 25. | ජේ.ජේ.නාලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 14847.00 |
| 26. | එම්.ගාමිණී මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 12048.00 |
| 27. | ධර්මදාස රණතුංග මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 3109.00 |
| 28. | බී.දයාසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 3571.00 |
| 29. | සුජ්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7053.00 |
| 30. | ජේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 1753.00 |
| 31. | ජේ.ජේ.ආනන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 1970.00 |
| 32. | එම්.ජී.සුගත් තිලක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 7911.00 |
| 33. | ගයාන් සමන්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 5777.00 |
| 34. | අමර ශේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 6133.00 |
| 35. | රෝහිත ඩිල්ෂාන් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 9511.00 |
| 36. | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 9866.00 |
| 37. | සහන් චතුරංග මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 8250.00 |
| 38. | ජී.ජී.රංජිත් මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 2096.00 |
| 39. | ජේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 1476.00 |
| 40. | අමිල සම්පත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 4546.00 |
| 41. | ආර්.සංජීව මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 2778.00 |
| 42. | තරිඳු දිනේෂික මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල දීමනා ගෙවීම | 8250.00 |
| 43. | තරිඳු දිනේෂික මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 2100.00 |
| 44. | එම්.පසිඳු උදාර මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 350.00 |
| 45. | ආර්.කේ.එස්.පී.නිල්මිණී මිය,කළමනාකරණ සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 1060.00 |
| 46. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | 53-1634 කැබ් රථය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 14320.00 |
| 47. | සී/ස ගුණවර්ධන සහ (පුද්) සමාගම,මහ විදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළව ගෙවීම | |

| | | | |
|---|---|---|---|
| | | • ග්ලාස් ක්ලීනර් 475ml 20-රු4500.00<br>• සැනිටයිසර් 5L කෑන් 20-රු52000.00<br>• Lifebouy සබන් 300-රු 19800.00<br>• ඉදල් 50-රු9250.00<br>• ලයිසෝල් 500ml බෝතල් 10-රු2250.00 කොසු ප්ලාස්ටික් 20-රු8800.00<br>• හාපික් 500ml බෝතල් 20-රු4000.00<br>• තණකොළ කපන මැෂින් තල 10-රු6500.00 | 107100.00 |
| 48. | චන්ද්‍ර ස්ටෝර්ස්,අංක 107,කොලින් වීදිය,ගොඩකවෙල | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම කිරීම | 208300.00 |
| 49. | ජී.සමීර මධුසංක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 4200.00 |
| 50. | කේ.පී.රමාසිරි සඳරුවන් මයා,සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 2100.00 |
| 51. | කේ.එරංග රවිනාත් මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022මාර්තු මස ගමන් වියදම් | 1400.00 |
| 52. | ඒ.පී.ප්‍රියමාල් හංසන මයා, සංවර්ධන නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022මාර්තු මස ගමන් වියදම් | 1400.00 |
| 53. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 24750.00 |
| 54. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 2656.00 |
| 55. | ජාතුන්ගේ පීරිස් අප්පු මයා,ඉදිකැටිය,වෙළඳගොඩ,කිරම | කිරම පොදු වෙළඳපල ඉඩමේ පොල් එලදාව ටෙන්ඩරය 2021 වර්ෂය ලබා ගැනීම සඳහා 2020 වර්ෂයේ තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල නිදහස් කිරීම | 2000.00 |
| 56. | ජාතුන්ගේ පීරිස් අප්පු මයා, ඉදිකැටිය,වෙළඳගොඩ,කිරම | කිරම පොදු වෙළඳපල ඉඩමේ පොල් එලදාව සඳහා 2021 වර්ෂයේ තැන්පත් කර ඇති 25% ආරක්ෂිත ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 3878.75 |
| 57. | ජේ.ඩිලාන් මයා,මිද්දෙනිය පාර, කටුවන | 2022 පෙබරවාරි මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7310.00 |
| 58. | ඩබ්.ඒ.දනිතා සුභාෂණි මිය,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනිය | 2022 පෙබරවාරි මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 6780.00 |
| 59. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.03.21 දින පැවති සැලසුම් කමිටු සඳහා දීමනා ගෙවීම | 6000.00 |
| 60. | එච්.ජී.ඒ සරත්චන්ද්‍ර මයා,වලස්මුල්ල මෝටර්ස්,විරකැටිය පාර,වලස්මුල්ල | LL-9589 ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල් ගෙවීම | 12500.00 |
| 61. | සී/ස ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව,අංක 15,දුම්රියපොළ පාර,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ හා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට අදාලව ගෙවීම් කිරීම | 52407.00 |

| | | | |
|---|---|---|---|
| 62. | ජේ.ඩී.සී.චාන්දනී මිය,කළමනාකරණ සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශිය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 800.00 |
| 63. | එස්.එම් දිල්රුක්ෂි මිය,කළමනාකරණ සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශිය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 700.00 |
| 64. | ජේ.එච්.සී.එස්.අබේදීර මයා,වෛද්‍ය නිළධාරී, කටුවන ප්‍රාදේශිය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් | 700.00 |
| 65. | විජිත සර්විස් සෙන්ටර්,කටුවන පාර,මිද්දෙනිය | LL-7399 ජල බවුසරය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 22430.00 |
| 66. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | 227-5870 වෑන් රථය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 16110.00 |
| 67. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | 252-6508 කැබ් රථය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 18960.00 |
| 68. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශිය සභාව | 2022 පෙබරවාරි මස අතිකාල | 9136.00 |
| 69. | නන්දන කරුණාතිලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශිය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 12950.00 |
| 70. | අයි.ජී.මහින්ද මැණිකුමා,සභාපති, කටුවන ප්‍රාදේශිය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් | 10000.00 |
| 71. | සෝමසිරි ස්ටෝර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,රන්න පාර,අඟුණකොළපැලැස්ස | 2022.03.18 කටුවන ආදාහනාගාරය සඳහා 37.5 kg ගෑස් පිරවූ සිලින්ඩර් 05 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 65315.00 |
| 72. | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,කටුවන | PF-7414 කැබ් රථය වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 19330.00 |
| 73. | එම්.ජේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක,කටුවන ප්‍රාදේශිය සභාව | 2022 ජනවාරි මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 3000.00 |
| 74. | රුවනි ගෑජ් ෂීප් කම්පනි,මහ විදිය, කොබෙයිගනේ | කටුවන ප්‍රාදේශිය සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතියට අවශ්‍ය කුකුල් පොහොර 14830 kg මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 222960.00 |
| 75. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශිය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 13390.00 |
| 76. | මද්දුම ලියනගේ මයා,නීති කාර්යාලය,අංක 07/14,මාර්කට්,වලස්මුල්ල | P-1577,L-971,M-878 දරන නඩුවල ගාස්තු ගෙවීම | 42500.00 |
| 77. | වීරසිංහ දයාරත්න මයා, මණ්ඩාඩුව, වීරකැටිය | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නඩු අංක71431 දරණ නඩුවෙහි ලේඛණ ගාස්තු හා නඩු ගාස්තු ගෙවීම | 10000.00 |
| 78. | එම්.පී.අමරසේන මයා, කටුවන ප්‍රාදේශිය සභාව | 2022 ජනවාරි මස ජල ව්‍යාපෘතියේ බිල් බෙදීම් කටයුතු සඳහා මසකට 400 km ඉක්මවා මග් කියවුම් වෙනුවෙන් ලබා දෙන දීමනාව | 1000.00 |
| 79. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 මාර්තු මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල ගෙවීම | 7930.00 |

| | | | |
|---|---|---|---|
| 80. | ඩබ්.ජ්.වසන්ත කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 ජනවාරි මස ජල ව්‍යාපෘතියේ බිල් බෙදීම් කටයුතු සඳහා මසකට 400 km ඉක්මවා මත් කියවුම් වෙනුවෙන් ලබා දෙන දීමනාව | 1000.00 |
| 81. | පළාත්භාර අධ්‍යක්ෂ (දකුණ),මාර්ග සංවර්ධන අධිකාරිය,මාතර | 2021.11.24 දින සිදු කරනන ලද ජල නල සවිකිරීම සඳහා මාර්ග පළුදු කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම<br>• මිද්දෙනිය වීරකැටිය පාර පොළට යන මාර්ගය ඉදිරිපිට මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් ගෙවීම-රු31578.75<br>• මිද්දෙනිය පනාමුර පාර ගෙන්ඩ්‍රික් ඇට කඩය ඉදිරිපිට මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම-රු36491.00 | 68069.75 |
| 82. | එම්.දිනුෂ්ක රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 83. | එල්.ඩී.ඩී.දුල්ෂානි මිය,ලක්ෂාන් ඇඩවර්ටයිසින් සර්විස්,වීරකැටිය පාර,මිද්දෙනිය | කිරම බස්නැවතුම්පොළෙහි සමාරම්භක හා ගම්නාන්ත දැක්වෙන දැන්වීම් පුවරු නිර්මාණය කිරීමට අදාළව ගෙවීම් කිරීම | 73200.00 |

ඉහත වවුචර් අංක 01 සිට 83 දක්වා වූ වවුචර් ගෙවීම් කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) කටුවන ප්‍රාදේශීය සභාව විසින් වාහන සඳහා ඉන්ධන සපයා ගනු ලබන වීරකැටිය විවිධ සේවා සමුපකාර සමිතියට අයත් මිද්දෙනිය ඉන්ධන පිරවුම්හලේ පවත්නා ඩීසල් නොමැතිකම හේතුවෙන් සභාවේ සියළු වාහන ඉන්ධන අවසන්ව නවතා දැමීමට සිදුවන තත්වයක් උද්ගතව ඇති බැවින් ඩීසල් පවත්නා ඛනිජතෙල් නීතිගත සංස්ථාව යටතේ නියාමනය වන වෙනත් බාහිර ඉන්ධන පිරවුම්හලකින් හෝ ඉන්ධන ලබා ගත යුතුව ඇත. එසේ ලබා ගන්නා විට මුදලින් ගෙවීම් කිරීමට සිදු වන බැවින් අවශ්‍යතාවය මත වරකට රු.100000/= සීමාවක් යටතේ අත්තිකාරම් ලබා දී ඉන්ධන සපයා ගැනීම සුදුසු බව යෝජනා විය.

2) කටුවන ප්‍රාදේශීය සභාවේ ප්‍රයෝජනය සඳහා තෙල්කැපේ මැෂින් 02 ක් මිල ගණන් කැඳවා ලබා ගැනීමට සුදුසු බව යෝජනා විය.

3) සුළු මුදල් ප්‍රතිපූරණය කිරීමේදී සතියක් තුල සිදු කරනු ලබන වියදම් සියල්ලම එම සතිය තුළදීම අදාළ විෂය නිළධාරීන් විසින් බිල්පත් ඉදිරිපත් කර එම සතියේදීම ප්‍රතිපූරණය කිරීම සුදුසු බව යෝජනා විය.

4) සැපයුම්කාර ආයතන හා පාර්ශව වෙත ගෙවිය යුතු බිල්පත් පියවීමේදී ඉදිරිපත් කරනු ලබන ගෙවීම් වවුචර් සඳහා ඇතැම් අවස්ථාවල ඇලවිය යුතු මුද්දර ඇලවා අත්සන් කිරීමට නොහැකි වන අවස්ථා නිරීක්ෂණය වූ බැවින් ඒ සඳහා විසඳුමක් ලෙස මිල ගණන් පිළිගැනීමේ ලිපිය(P.O) සමඟ ගෙවීම් වවුචරය එම ආයතන වෙත යැවීමට විෂය නිලධාරී දැනුවත් කිරීම සහ මුද්දර ඇලවිය නොහැකි අවස්ථාවන්වලදී එම ඇලවිය යුතු මුද්දර වටිනාකම බිල්පත් මුදලින් අඩු කිරීම සුදුසු බවටත් යෝජනා විය.

5) පහත සඳහන් භාණ්ඩ කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය කාර්යාලයේ ගබඩාව වෙත ලබා දෙන මෙන් සෝ.රූමේෂ් මහතා විසින් ඉල්ලීම් කර ඇත.

- A4 පැකට් -50
- ජල මීටර්-500
- HP Laser 107 a toner-500
- කාඩ්බෝඩ් ෆයිල් කවර-1000
- කැල්කියුලේටර්-10
- 1'සුදු සෙලෝටේප්-20
- 2' බොන්ඩර් ටේප්-15
- ගම් බෝතල් (මධ්‍යම ප්‍රමාණය) -15
- canon LBP 214dw-01

ඉහත භාණ්ඩ ලබා දීමට සුදුසු බව යෝජනා විය.

ඉහත වවුචර් අංක 01 සිට 83 දක්වා වූ වවුචර් ගෙවීම කිරීම සුදුසු බවත් අංක 01 සිට 05 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ නිර්දේශ විය.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙම මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අංක 74 යටතේ තියන රුවනි ශොප් ඔෆ් කම්පනි, මහ වීදිය, කොබෙයිගනේ ලිපිනය යටතේ කුකුල් පොහොර 14830 kg ක් මිලදී ගැනීමට රු. 222960.00ක් වියදම් කරලා තියෙනවා. මේ සම්බන්ධව දැන ගන්න කැමතියි. මෙම කුකුල් පොහොර ආසන්න ස්ථානයකින් මිලදී ගන්න තිබුණේ නැද්ද? අපි දැනට නිෂ්පාදන කරන කොම්පෝස්ට් වලට කුමක්ද කරන්නේ. ඒවා බෙදා හරිනවද? ඉදිරියේදී කොම්පෝස්ට් ඉල්ලුම අඩුවෙයි නේද? යූරියා පොහොර හොඳයි කියලා ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළා නේද? එහෙම වුණොත් අපේ කොම්පෝස්ට් නිෂ්පාදනය අපතේ යයිද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කොහේවත් කුකුල් පොහොර ගන්න තිබුණේ නැහැ. ඒ නිසයි එහෙන් ගෙන්නන්න සිදු වුණේ. මොකද අපි බොයිලර් කුකුලන්ගේ පොහොර ගන්නේ නැහැ. බිත්තර දාන කුකුලන්ගේ පොහොර පමණයි ගන්නේ. අපි දැනට කිලෝ පනස්දහසකට වඩා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරලා තියෙනවා. නමුත් මේ සඳහා ප්‍රමිති සහතිකය ලබා ගන්නා තෙක් බෙදා හැරීම කළේ නැහැ. අපි එය පොල් පර්යේෂණ එකෙන් ලබා ගත්තා. අපේ කොම්පෝස්ට් සඳහා ඉල්ලුමක් තියෙනවා. අපිට දැනටත් වෙළඳපොළට යවලා විකුණන්න පුළුවන්. එහි ගැටළුවක් නැහැ.

<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍ර සේන මැතිතුමා</u>

මමත් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේදී මේ සම්බන්ධයෙන් විමසීමක් කළා. නමුත් මේ පොහොර ගෙන්වීමේදී ඒ අය ප්‍රවාහන පහසුකම් සහිතව ගෙනත් දුන්න නිසා අලාභයක් වෙන්නේ නැහැ.

ඒ අනුව අංක 01 සිට 83 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් අංක 01 සිට 05 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධවත් විවාදික අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 මාර්තු මස**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂයේ මාර්තු මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලෑලි මගින් රු.581580.00ක ආදායමක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 65318.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.516262.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මාර්තු මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 මාර්තු මස**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 මාර්තු මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු: 977450.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,රියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු: 860787.00 ක වියදමක් දරා ඇත. එමෙන්ම මෙම යන්ත්‍රෝපකරණ මගින් රු: 116663.00 ක ලාභයක් ලබා ඇත.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ.ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මාර්තු මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 මාර්තු**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා මාර්තු මස රු.621209.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මාර්තු මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොමැති බැවින් සියලු මන්ත්‍රීතුමන්ලාගේ එකගතාවය මත සභා සම්මත කරන ලදී.

**06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 පෙබරවාරි මස**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 පෙබරවාරි මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු:3058472.36 ක් වන අතර මාසික වියදම රු. 716229.70 ක් වේ. ඒ අනුව මාසික ලාභය රු: 2342242.66 කි. ඒ අනුව පෙබරවාරි මාසයට අදාළ ජල විශ්ලේෂණ වාර්තාව සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම එම්.පී.යි.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 පෙබරවාරි මස ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම -2022 පෙබරවාරි මස**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 පෙබරවාරි මස වන විට ආරම්භක හිඟය රු:9145681.97 ක් වන අතර ජනවාරි මස අවසාන හිඟය රු:8951926.97 ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු:193755.00 කි. මෙම වාර්තාව සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 පෙබරවාරි මස මාසික ජල හිගය අඩු වැඩි වීම සම්බන්ධ වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **06 - 7. කර්මාන්ත කමිටු වාර්තා -2022 -03-30 වන දින සහ 2022.04.08 වන දින**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022.03.30 වන දින සහ 2022.04.08 වන දින කර්මාන්ත කමිටු වාර්තා අනුමත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

**2022.03.30 වන දින කර්මාන්ත කමිටු වාර්තාව**

01. ගම සම පිළිසඳරක් 2022 අය වැය යෝජනා යටතේ ව්‍යාපෘති 05ට අදාළව ප්‍රතිපාදන කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වෙන් කර ඇති අතර ඊට අදාළ ඇස්තමේන්තු සකස් කර සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සුදුසු බව.
02. තවද මිද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු මැල්ලකැටිගොඩ ගොවි සමිතියට ලබා දීම සුදුසු බවද එහි ඇස්තමේන්තුව 2022.01.20 දින මහා සභා තීරණය අනුව සංශෝධනය කර ඊට අදාල ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබූ අතර ඒ අනුව එහි ඉදිකිරීම් කිරීම සුදුසු බව තීරණය විය.
03. කටුවන මහජන පොළෙහි කඩකාමර ඉදිකිරීමට අදාළ ඇස්තමේන්තුව හම්බන්තොට ස.පා.ප. කොමසාරිස් කාර්යාලය වෙත යැවීම.
04. කරමැටිය බිත්තැන්න දේවාල ගෙදර මාර්ගය පුනිසංස්කරණයට අදාළ බිල්පත 10% රැඳවුම් හැර ගෙවීමට සුදුසු බව.
05. වීදිකන්ද ග්‍රාම නිලධාරී වසමේ ජල පොම්පාගාරයේ සිට අක්කර 15 දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම් කර්මාන්තයේ වැඩ අවසන් කර බිල්පත ඉදිරිපත් කර තිබූ අතර ඊට අදාළව 10% හැර ඉතිරි මුදල් ගෙවීම සුදුසු බව.
06. තවද බටගස්ස හේන්ගොඩ පාර ප්‍රතිසංස්කරණය කිරීම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු අගලකුඹුරුගොඩ ගොවි සමිතියට ලබා දීම සුදුසු බව.
07. පංගම්විලයාය හොරොක්ගහගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම් කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු ජයසක් ගොවි සමිතියට ලබා දීම සුදුසු බව.
08. වැතැන්න මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුක්මල්පිටිය පුබුදු ගොවි සංවිධානයට ලබා දීම සුදුසු බව

09. තවද උල්පත අසල සිට අඹගස්ආර පාර සංවර්ධනය කිරීම කටයුතු වැලිපිටිය සමඟි ගොවි සංවිධානයට ලබාදීම සුදුසු බව

10. කිරම ධම්මානන්ද විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තු සකස් කර අදාළ ආයතන වෙත යැවීම සුදුසු බවද තීරණය විය.

    මීට අමතරව 2021 වසරේ සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද පනත කර්මාන්ත වල රැඳවුම් කාල සීමාව ඉක්මවා ගොස් ඇති බැවින් එම කර්මාන්ත වල රැඳවුම් නිදහස් කිරීම සුදුසු බවද තීරණය විය.

11. අගලකුඹුරුගොඩ වැව්පාර, බටමණ්ඩිය පාර සංවර්ධනය කිරීම.
12. දෙමටකැටිය අතුරු මාර්ගය සංවර්ධනය කිරීම.
13. කලාකැටිය මාර්ගය සහ කොස්ගහහේන මාර්ගය සංවර්ධනය කිරීම.
14. වැලිමණ්ඩිය මාර්ගය සහ ටෙලිෆෝන් කණුව අසල මාර්ගය සංවර්ධනය කිරීම.
15. ගොමඩිය වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය සකස් කිරීම.
16. මුවැල්ලගොඩ මහවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.
17. කිරම පොළ සංවර්ධනය කිරීම 2වන අදියර.
18. ඇඹවියතැන්න මාර්ගය සහ සියාරපිටිය අමෙත්‍රී මාවත කපා සකස් කිරීම.
19. සුමනන්ත්‍රිනන්ද මුරුතහේන මාර්ගය, උඩත පිඹද්ද මාර්ගය, මීනිරන් පොළ පාර, සුමනන්ත්‍රිනන්ද ආරණ්‍ය අතුරු මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.
20. මාහේන කන්ද හරහා දෙමටකැටිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.
21. හිඳකරල්දෙණිය 18 කණුව දක්වා මාර්ගය කැපීම.
22. රුක්මල්පිටිය පනුවන්කුයාය සිට පාසල දක්වා මාර්ගය 1,2 කොටස්.
23. උල්පතගම මාර්ගය ඉත්තගලහේන මාර්ගය, පොල්කොරටුව මාර්ගය සංවර්ධනය කිරීම.
24. මිද්දෙනිය මහින්ද නාහිමි මාවත ප්‍රතිසංස්කරණය කිරීම.
25. කිරම නගරයේ ATM යන්ත්‍රයක් සකස් කිරීමට කුටියක් සකස් කිරීම.
26. අගලබඩ බෝධිය මාර්ගය කපා සකස් කිරීම.
27. ලෝලුගොඩ මාර්ගය කපා සකස් කිරීම.
28. උලහිටියාව අමුදමන ඇළ මාර්ගයේ පාලමක් ඉදි කිරීම.
29. නම්නැලිය කැටපොලගොඩ මාර්ගය කබරගෝමඩිත්ත මැදපාර මාර්ගය සකස් කිරීම.
30. මැදගම්ගොඩ පිස්සුබැද්ද මාර්ගයේ බෝක්කුව සකස් කිරීම.

## <u>2022.04.08 වන දින කර්මාන්ත කමිටු වාර්තාව</u>

01. බටගස්ස හේන්ගොඩ මාර්ගය කපා සකස් කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් හැර ඉතිරි මුදල් ගෙවීම.

02. උල්පත අසල සිට අඹගස්ආර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 10% රැඳවුම් හැර ඉතිරි මුදල් ගෙවීම.

03. වැනැන්න රඹුම් පාර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 10% රැඳවුම් හැර ඉතිරි මුදල් ගෙවීම.

04. කල්වත්ත මොරකන්දගොඩ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 10% රැඳවුම් හැර ඉතිරි මුදල් ගෙවීම සුදුසු බව මෙදින කමිටු රැස්වීම තීරණය කරන ලදී.

05. තවද මිද්දෙනිය පොදු වැසිකිලිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීමට අදාල සංශෝධිත ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබූ අතර, අදාළ ඇස්තමේන්තුවට අනුව එහි ඉතිරි වැඩ කොටස සම්පූර්ණ කිරීම සුදුසු බවද මෙහිදී යෝජනා විය.

06. මිද්දෙණිය සුපිරි වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ ඇති වැසිකිළි පද්ධතිය කඩා ඉවත් අදාළ ස්ථානයේ කඩ කාමරයක් සකස් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුව සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවද මෙදින කමිටුව තීරණය කරන ලදි.

07. අඹුදමන පාලම සකස් කිරීම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස නිම කර ඊට අදාළ බිල්පත් සහ මිද්දෙණියේ සිට කටුවන දක්වා වැටෙන වත්තගේන්ගොඩ මාර්ගයේ පාලම දෙපය ඇති බැමි දෙකක් සකස් කිරීම කර්මාන්තයේ බිල්පත් ගෙවීම් කටුයුතු කිරීම සඳහා සහකාර කොමසාරිස් හම්බන්තොට වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව මෙදින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේදී යෝජනා විය.

08. කිරම පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර තුනක් සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව සහකාර කොමසාරිස් හම්බන්තොට වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව මෙදින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේදී යෝජනා විය.

09. කිරම බස් නැවතුම්පොළ භූමියේ එක් වන් මුදලින් ඉදිකිරීමට අපේක්ෂිත කඩ කාමර දෙකට අදාල ඇස්තමේන්තුව සහකාර කොමසාරිස් හම්බන්තොට වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව මෙදින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේදී යෝජනා විය.

10. කටුවන නව පොල භූමියේ ඉදි කිරීමට අපේක්ෂිත කඩ කාමර එකොළහට අදාළ ඇස්තමේන්තුව සහකාර කොමසාරිස් හම්බන්තොට වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව මෙදින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේදී යෝජනා විය.

11. නවද ගම සමඟ පිළිසඳරක් වැඩසටහන 2022 වැඩසටහන යටතේ කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපාදන වෙන්කර ඇති කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉසුරු මාවත සිට සමගි මාවත දක්වා මාර්ගය කපා සකස් කිරීම කර්මාන්තයේ වැඩ අවසන් කර බිල්පත ඉදිරිපත් කර තිබූ අතර,අදාළ බිල්පත කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවද කමිටුව තීරණය කරන ලදි
ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022.03.30 වන දින හා 2022.04.08 වන දින කර්මාන්ත කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කර්මාන්ත කමිටු වාර්තා සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 07 වාර්ථා

### ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස.07 ආදායම් අයකර ගැනීම හා හිග ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
    1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
    2. 0077187171- මෙහෙයුම් හා නඩත්තු ගිණුම
    3. 0072633606- කර්මාන්ත ගිණුම
    4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
    5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
    6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 මාර්තු මස ප්‍රා.ස. 07 වාර්තා

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මාර්තු මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රාස 07 වාර්තා සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

### 08-1. භාණ්ඩ සමීක්ෂණ ,වෙන්දේසි හා අපහරණ කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම මැයෙන් අංක කප්‍රාස /19/1 හා 2022.04.08 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශයන්ට අනුව භාණ්ඩ වෙන්දේසිය හා අපහරණය සිදු කර අදාළ කමිටු වාර්තාව අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවත් ඒ සමගම ප්‍රාදේශීය සභා භූමියේ සහ මිද්දෙනිය බිබුල ජල බලාගාරය අසළ ඇති අබලි ද්‍රව්‍ය භාණ්ඩ අපහරණය කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවත් මෙම කමිටුව සඳහා 2021 භාණ්ඩ සමීක්ෂණයේ කමිටු සාමාජිකයින්ම පත්කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපේ ප්‍රාදේශීය සභාවේ ලිපි ලේඛන වල අන්තර්ගත නොවන අබලි භාණ්ඩ තැන් තැන් වල තියෙනවා. අපිට මේ අවස්ථාවේ ඒ ටිකත් ඉවත් කර ගන්න පුළුවන්. මහ ට්‍රැක්ටර් ටේලර්, දිරාපු බවුසර් වැනි දේවල් ටිකක් දිරාපත්ව තියෙනවා. මේ සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ හිටපු සාමාජිකයින්ගෙන් කමිටුවක් පත් කරලා මේ භාණ්ඩ හඳුනාගෙන ඉක්මණින් ඉවත් කරන්න හියමු.

ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ වෙන්දේසි හා අපහරණ කමිටු වාර්තාව අනුමත කිරීම සම්බන්ධවත් ඒ සමගම ප්‍රාදේශීය සභා භූමියේ සහ මිද්දෙනිය බිබුල ජල බලාගාරය අසළ ඇති අබලි ද්‍රව්‍ය භාණ්ඩ අපහරණය කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදු කිරීම සම්බන්ධවත් මෙම කමිටුව සඳහා 2021 භාණ්ඩ සමීක්ෂණයේ කමිටු සාමාජිකයින්ම පත්කිරීම සම්බන්ධවත් විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

### 08-2. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පුස්තකාල ග්‍රන්ථයක් ලෙස නිර්දේශිත අපේ කතාව ග්‍රන්ථය මිලදී ගැනීම

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මගින් පුස්තකාල ග්‍රන්ථයක් ලෙස නිර්දේශිත අපේ කතාව ග්‍රන්ථය මිලදී ගැනීම මැයෙන් දෙහිවල, නැදිමාල, 41A, පියරතනාරාම පාර, ඩී.එස්.එම්.නිහාල් රණසිංහ යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ඔහු විසින් රචිත අපේ කතාව නම් කෘතිය ප්‍රාදේශීය සභා පුස්තකාල හතර සඳහා පිටපත් 2 බැගින් පිටපත් 8ක් සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ කෘති පුස්තකාල සඳහා අරගෙන දෙමු.

ඒ අනුව අපේ සභාව නම් කෘතිය ප්‍රාදේශීය සභා පුස්තකාල හතර සඳහා පිටපත් 2 බැගින් පිටපත් 8ක් සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-3 මීද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීම හා පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම සඳහා වන ඇස්තමේන්තුව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මීද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීම හා පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම සඳහා සකස් කර ඇති රු. 510077.93 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවත් එම කටයුතු කඩිනමින් සභා අරමුදල් මගින් සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපිට මෙ සඳහා සභා අරමුදල් ප්‍රමාණවත් වෙයිද කියලා දන්නෙ නැහැ.

**ගරු ප්‍රා.ස.ම.ආරියරත්න ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මේ අවස්ථාවේ සභාවේ ආදායම් ඉතා පහළ මට්ටමක පවතින නිසා මෙවැනි සංවර්ධන කටයුතු කරන්න පුළුවන්ද? මෙම යෝජනාව කාගේ හරි යෝජනාවක්ද? මේක කළ යුතු වැඩක් . ඒත් එක්කම අනෙක් කාරණය විදියට මාර්ග වල පදිකයින් ගමන් කරන කැට ගොඩක් අක්‍රමවත් වෙලා තියෙන්නේ. මම හිතන්නේ මේවා සකස් කරන්න ඕන නාගරික සංවර්ධන අධිකාරියෙන් වෙන්න ඇති . අපි ඒ සඳහා ඉල්ලීමක් කරමු. මොකද කුඩා ළමුන් , වයසක අයට මෙයින් අනතුරු වෙන්න පුළුවන්. මීද්දෙනිය පමණක් නොවෙයි කිරම, කටුවන ආදි නගර වලත් මාර්ග වල මේ තත්වය තියෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

මෙ වැසිකිළිය පිළිසකර කිරීමට අපේ සනත් මන්ත්‍රීතුමත් සහ ගාමිණී සංජීව මන්ත්‍රීතුමන්ලා යෝජනා ගෙනාවා. ඒ අනුව තමයි මෙ ඇස්තමේන්තු සකස් කලේ. අපිට මූල්‍යමය ගැටළුවක් තියෙනවා. නමුත් අපේ සභාව සතුව ස්ථාවර තැන්පතු ලෙස මුදල් තැන්පත් කරලා තියෙනවා. අපේ අවශ්‍යතාවය පරිදි එම මුදල් සභාවේ වියදමට යොදා ගන්න පුළුවන්. මොකද බැංකු වල තැන්පත් කර තැබීමට වඩා අපේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම ප්‍රයෝජනවත් වෙනවා. මාර්ග වල පදිකයින් ගමන් කරන කැට නැවත සකස් කිරීමට අපි නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරමු.

**ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ජ්. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙ සඳහා මුදල් ප්‍රතිපාදන ලැබුණ දිනක මේ පිළිසකර කිරීම කරන්න කියලා ඉල්ලීම කරනවා. මේක අත්‍යවශ්‍ය කාරණයක්.

ඒ අනුව මීද්දෙනිය පොදු වැසිකිළිය ඉදිරිපිට බිම් කොටස කොන්ක්‍රීට් කිරීම හා පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම සඳහා සකස් කර ඇති රු. 510077.93 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සම්බන්ධවත් එම කටයුතු කඩිනමින් සභා අරමුදල් මගින් සිදු කිරීම සම්බන්ධවත් විවාධික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08- 4 .උලහිටියාව දූවන ගෙදර මාර්ගය සංශෝධනය කිරීම

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ජී. සංජීව මැතිතුමා**

උලහිටියාව කොට්ඨාශයේ මාර්ග සංවර්ධනය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් සංවර්ධනය සඳහා යෝජනා කරන ලද උලහිටියාව ග්‍රාම නිළධාරි වසමෙ දූවන ගෙදර මාර්ගය වෙනුවට උලහිටියාව බටහිර කොට්ටම්බ ගස ළග සිට කෝපිවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. මාහෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඒ සංශෝධනය සිදු කරලා දෙන්නම් . ඉක්මණින් මේ සංවර්ධන කටයුතු සිදු කරන්න.

ඒ අනුව 2022 අයවැය මගින් උලගිටියාව කොට්ඨාශයේ මාර්ග සංවර්ධනය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මගින් සංවර්ධනය සඳහා යෝජනා කරන ලද උලගිටියාව ග්‍රාම නිළධාරි වසමේ දූවන ගෙදර මාර්ගය වෙනුවට උලගිටියාව බටගිර කොට්ටම්බ ගස ළඟ සිට කෝපිවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## <u>08-5. රථවාහන නැවතුම් බදු අය කිරීම සම්බන්ධවයි</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

රථවාහන නැවතුම් බදු අයකිරීම සම්බන්ධවයි මැයෙන් 2022 වර්ෂයේ මිද්දෙනිය රථවාහන නැවතුම් බදු අයකිරීමේ ටෙන්ඩරය ලබා දී ඇති මිද්දෙනිය, ශ්‍රී මහින්ද නාහිමි මාවතේ , සිතාර ලිපිනයෙහි පදිංචි ජේ.ඒ. අනුර මයා විසින් රට තුළ පවතින ඉන්ධන අර්බුධය හේතුවෙන් මිද්දෙනිය නගරය වෙත රථ වාහන පැමිණීම විශාල ලෙස අඩු වී ඇති බැවින් 2022 අප්‍රේල් මාසය සඳහා ආදායමක් නොලැබුණු හෙයින් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව එම මාසයේ ටෙන්ඩර් බදු මුදලින් 25% ක් අඩු කර අය කර ගැනීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ රථවාහන ටෙන්ඩරය ලබා ගත්ත අය සහනයක් ඉල්ලා තියෙනවා. මොකද මේ දිනවල ඉන්ධන අර්බුධය නිසා පිලිවරි වාහන නොපැමිණීමෙන් ඒ අයගේ ආදායම අඩු වෙලා. කොරෝනා වසංගත කාලය තුළ මෙවැනි සහන ලබාදෙන්න අපිට ආණ්ඩුකාර අනුමැතිය ලැබුණා. නමුත් මේ සඳහාත් සහනයක් ලබා දීම සම්බන්ධව අපිට ආණ්ඩුකාරතුමාගෙන් අනුමැතියක් ලබා ගන්න පුළුවන්ද කියලා බලමු. නමුත් ඒ සඳහා අඩු කරන ප්‍රතිශතය කීයද කියලා තීරණය කරන්න අවශ්‍යයි.

<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>

අපිට සභාවට ලැබෙන ආදායම අහිමි කරන්න බැරි නිසා අපි මාසිකව අය කරන මුදලින් යම් ප්‍රතිශතයක් අඩු කරලා අය කිරීම සම්බන්ධව තීරණයක් අරගෙන එය ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය පරිදි සිදු කරමු.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඔව්, එහෙම නම් අපි මාසික ටෙන්ඩර් මුදලින් 25% ක් අඩු කර ඉතිරිය අය කරන්න තීරණයක් අරගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවමු.

ඒ අනුව රථවාහන නැවතුම් බදු සම්බන්ධව 2022 අප්‍රේල් මාසය සඳහා ආදායමක් නොලැබුණු හෙයින් එම මාසයේ ටෙන්ඩර් බදු මුදලින් 25% ක් අඩු කර අය කර ගැනීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

**<u>08-6. ඉන්ධන දීමනාව සම්බන්ධව</u>**

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ඉන්ධන දීමනාව සම්බන්ධවයි මැයෙන් ජල බිල් බෙදීමේ කාර්යයෙහි නියුතු ඩබ්.ඒ.වසන්ත මයා සහ එම්.පී. අමරසේන මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ජල බිල් බෙදීමේ කාර්යය සඳහා 500km ක් පමණ දුරක් ගමන් කිරීමට සිදු වන බැවින් ඒ සඳහා ඉන්ධන ලීටර් 7.5 කට ආසන්න ප්‍රමාණයක් අවශ්‍ය වන බවත් දැනට ලබා දෙන රු. 1000.00ක දීමනාව ප්‍රමාණවත් නොවන අතර එය වැඩි කර දෙන මෙන් ඉල්ලුම් කර ඇත. ඒ අනුව අදාළ සේවකයින් වෙත අවශ්‍ය වන ඉන්ධන ලබා ගැනීම සඳහා පවතින ඉන්ධන මිල අනුව මාසිකව ඉන්ධන ලීටර් 7.5ක් සඳහා වැය වන මුදල දීමනාව ලෙස ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී පී.කොඩිතුවක්කු මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා.</u>**

මේ දීමනාව කී දෙනෙක් සඳහා ලබා දෙනවද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි දැනට දෙදෙනෙක් සඳහා දිරි දීමනාවක් ලෙස රු. 1000.00ක මුදලක් ලබා දෙනවා. නමුත් දැනට ඉන්ධන මිල ඉහළ යාමත් සමග මේ දීමනාව ප්‍රමාණවත් නොවන බව තමයි කියන්නේ. මේ සඳහා කලින් හතර දෙනෙක් හිටියා. පසුව අපි දෙදෙනෙක් සඳහා වාගේ එකක් දීලා දිරි දීමනාවක් ලබා දුන්නා.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා.</u>**

දැනට පවතින ඉන්ධන මිල සමග අපිට කරන්න පුළුවන් වෙන්නේ මේ අයට වැය වන ඉන්ධන ප්‍රමාණය සඳහා පවතින ඉන්ධන මිල අනුව දීමනාවක් ලබා දීම . එහෙම නැත්නම් පවතින මිල අනුව වැය වන ඉන්ධන ටික ලබා දීම. එතකොට ඉන්ධන මිල වෙනස් වීම ගැටළුවක් වෙන්නෙ නැහැ.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ඒ අදහස හොඳයි. අපි එහෙම කරමු.

ඒ අනුව අදාළ සේවකයින් වෙත අවශ්‍ය වන ඉන්ධන ලබා ගැනීම සඳහා පවතින ඉන්ධන මිල අනුව මාසිකව ඉන්ධන ලීටර් 7.5ක් සඳහා වැය වන මුදල දීමනාව ලෙස ලබා දීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>08-07. ස්ථාවර තැන්පත් අරමුදල් යොදා ගෙන සභා වියදම් සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම</u>**

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

ස්ථාවර තැන්පත් අරමුදල් යොදාගෙන සභා වියදම් සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම මැයෙන් 2022.04.18 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව දැනට කටුවන ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන පොදු අරමුදල් ගිණුම, පොළ ව්‍යාපෘති ගිණුම, ජල ව්‍යාපෘති ගිණුම් වල ශේෂයන් අවම මට්ටමක පවතින බැවින් ප්‍රාදේශීය සභාව සතු ස්ථාවර තැන්පතු ශේෂයන් නිදහස් කර ගෙන එදිනෙදා වියදම් පියවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව ඉදිරි වියදම් අවශ්‍යතාවයක් වුවහොත් එලෙස ස්ථාවර තැන්පතු නිදහස් කර වියදම් පියවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ජ් සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මේ කාරණය සම්බන්ධයෙන් කලින් කථා කළා. අපිට මහජන බැංකුවේ සහ ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ පවතින ස්ථාවර අරමුදල් තමයි මේ විදියට සභා අරමුදල් ලෙස යොදවා ගන්න වෙන්නේ. මේ සම්බන්ධව අපි විගණන නිළධාරින් සමග කථා කළාම තමයි ඒ අය කිව්වේ අතිරික්ත අයවැයක් සකස් කරන්න කියලා. එහෙම නැතිව ගන්න බැහැ කියලා.

**ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා.**

මේ මුදල් දැනට අරගෙන සභාවේ එදිනෙදා වියදම් පියවා ගන්න පුළුවන්. එදා සිටි නිළධාරින් එහෙම තැන්පත් කිරීමක් නොකර වියදම් කළා නම් අපිට අද ගන්න අරමුදලක් නැහැ. ඒ නිසා අපිට කුමක් හෝ ආදායම් උත්පාදනය වන සංවර්ධන ව්‍යාපෘතියකට මෙය යොදවනවා නම් ඵලදායි වෙනවා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපේ සභා ගොඩනැගිල්ල හදන්න වගේම , කටුවන පොළේ කඩ කාමර දහය, හිරම කඩ කාමර වැනි ප්‍රාග්ධන වත්කම් සකස් කරලා දෙන්න වැනි කටයුතු සඳහා යොදවන්න පුළුවන්.

**ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා.**

මෙම තැන්පතු යම් සංවර්ධන කටයුත්තක් ක්‍රියාත්මක වෙන කොට ගන්න ඕන. එදිනෙදා වියදම් කෙසේ හෝ පියවා ගන්න පුළුවන්. අනුමැතියක් අරගෙන තියලා එවැනි සංවර්ධන කටයුත්තකදී යොදවමු. එහෙම නැතිව අනවශ්‍ය දේකට යොදවන එකේ තේරුමක් නැහැ.

ඒ අනුව කටුවන ප්‍රාදේශිය සභාව විසින් පවත්වා ගෙන යනු ලබන පොදු අරමුදල් ගිණුම, පොළ ව්‍යාපෘති ගිණුම, ජල ව්‍යාපෘති ගිණුම් වල ශේෂයන් අවම මට්ටමක පවතින බැවින් ප්‍රාදේශිය සභාව සතු ස්ථාවර තැන්පතු ශේෂයන් නිදහස් කර ගෙන ඉදිරි වියදම් අවශ්‍යතාවයන් වුවහොත් වියදම් පියවා ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-08. ජාලකරණ සම්බන්ධතාවය ලබා ගැනීම සම්බන්ධව

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ජාලකරණ සම්බන්ධතාවය ලබා ගැනීම මැයෙන් කටුවන ප්‍රාදේශිය සභාවේ සංවර්ධන අංශය විසින් 2022.04.20 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව එම අංශයට අවශ්‍ය වයිෆයි රිපීටර් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී සිරිසේන හෙට්ටිගේ මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී. අදාළ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය දේවල් අරගෙන දෙමු.

ඒ අනුව සංවර්ධන අංශයට අවශ්‍ය වයිෆයි රිපීටර් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-9. හිරම ධම්මානන්ද විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුව අනුමත කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම මැයෙන් කිරම ධම්මානන්ද මහ විද්‍යාලය විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව ගරු තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගේ අනුග්‍රහයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් රු.4000000.00 ක මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින් ඒ අනුව සකස් කරන ලද රු. 4000000.00 ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවත් අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

එම සඳහා අදාළ කොන්දේසි වලට අනුකූලව ඇස්තමේන්තුවක් සකස් කරලා තියෙනවා. අපි එය අනුමත කරමු.

ඒ අනුව කිරම ධම්මානන්ද විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සංවර්ධනය සඳහා ගරු තරුණ කටයුතු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගේ අනුග්‍රහයෙන් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් රු.4000000.00 ක මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින් ඒ අනුව සකස් කරන ලද රු. 4000000.00 ඇස්තමේන්තුව අනුමත කිරීම සම්බන්ධවත් අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම සම්බන්ධවත් විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-10. කිරම ඉන්ධන පිරවුම් පොළ අසළ කඩ කාමර තුනක් ඉදිකිරීම සඳහා වන ඇස්තමේන්තුව</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

කිරම ඉන්ධන පිරවුම් පොළ අසළ කඩ කාමර 3ක් ඉදි කිරීම සඳහා සකස් කරන ලද රු. 4438134.53ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවත් ඒ අනුව අදාළ ඉදිකිරීම සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.ජී. ගාමිණී සංජීව මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මෙම කඩ කාමර තුන කඩිනමින් ඉදිකරලා ඒ අයට දෙන්න වෙනවා. නැත්නම් ගැටළු කිහිපයක් ඇති වෙනවා. අපි මේ කටයුතු කඩිනමින් කරමු.

ඒ අනුව කිරම ඉන්ධන පිරවුම් පොළ අසළ කඩ කාමර 3ක් ඉදි කිරීම සඳහා සකස් කරන ලද රු. 4438134.53ක ඇස්තමේන්තුව අනුමත කිරීම සම්බන්ධවත් එය කඩිනමින් සභා අරමුදලින් සකස් කිරීම සම්බන්ධවත් විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-11. 2022 අයවැය ප්‍රතිපාදන මගින් මාර්ග සංවර්ධනය</u>

<u>ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිනිය</u>

2022 අයවැය ප්‍රතිපාදන මගින් තල්වත්ත කොට්ඨාශයට අයත් මොරකන්ද ගොඩ මාර්ගය සංවර්ධනය කර ඇති අතර ඉතිරි මුදල් ප්‍රතිපාදන මගින් දරම්පිආර ලඳුකඩේ මාර්ගය සංවර්ධන කර දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ජී.සංජීව මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

එම ඉතිරි මුදල් වලට සරිලන පරිදි අපි ඇස්තමේන්තු සකස් කරන්න කියමු.

ඒ අනුව 2022 අයවැය ප්‍රතිපාදන මගින් තල්වත්ත කොට්ඨාශයට අයත් මොරකන්ද ගොඩ මාර්ගය සංවර්ධනය කර ඇති අතර ඉතිරි මුදල් ප්‍රතිපාදන මගින් දරම්ටිආර ලදුකගොඩ මාර්ගය සංවර්ධනය සඳහා ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-12. වවුචර් සඳහා ගෙවීම් කිරීම

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් එම වවුචර් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යයි යෝජනා කරමි.

01.වවුචර් අංක 290 - ඒ.පී.එස්. චින්තක - දිමුතු නිවස, 20 කණුව, කටුවන - 2022.01.18,දින සිට 2022.01.21 දින දක්වා පැවති ඩෙංගු වැඩසටහන සඳහා කුලී පදනම මත බැකෝ යන්ත්‍රයක් ලබා ගැනීම වෙනුවෙන් - රු. 75000.00

02.වවුචර් අංක 320 - සෙනොක් ට්‍රේඩ් කම්බයින් ( පුද්) සමාගම, තල් අරඹ , කඹුරුගමුව, මාතර - ZA 2978 අංක දරණ බැකෝ යන්ත්‍රයට Diper Arm seal kit එකක් මිලදී ගැනීම සඳහා - රු.18630.00

03. වවුචර් අංක 319 - සෙනොක් ට්‍රේඩ් කම්බයින් ( පුද්) සමාගම, තල් අරඹ , කඹුරුගමුව, මාතර - ZA 2978 අංක දරණ බැකෝ යන්ත්‍රයට seal kit, back hoe bucket එකක් මිලදී ගැනීම සඳහා - රු.16653.60

04.වවුචර් අංක 82 - ඩී.බී.ජේ. පුෂ්ප කුමාර, ජනහිත මෝටර්ස් , වලස්මුල්ල පාර, මිද්දෙනිය - සභාව සතු විල්බැරෝ යන්ත්‍ර හතරක් සහ තණකොළ මැෂින් තුනක් අලුත්වැඩියා කිරීම සඳහා - රු. 34150.00

05.වවුචර් අංක 81 - ඩී.බී.ජේ. පුෂ්ප කුමාර, ජනහිත මෝටර්ස් , වලස්මුල්ල පාර, මිද්දෙනිය - සභාව සතු 270-0429 ට්‍රැක්ටරය, හා RW 9001,67- 1924, RW – 4074 අංක දරණ ටේලර් අලුත්වැඩියා කිරීම සඳහා - රු. 69450.00

06. වවුචර් අංක 80 - ඩී.බී.ජේ. පුෂ්ප කුමාර, ජනහිත මෝටර්ස් , වලස්මුල්ල පාර, මිද්දෙනිය - සභාව සතු RD 4364 අංක දරණ ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සඳහා - රු. 266065.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී. එම වවුචර් සඳහා ගෙවීම් කරන්න.

ඒ අනුව මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් එම වවුචර් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-13. දික්ගොඩ හේන මාර්ගය සම්බන්ධවයි

**ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ. ගාමිණී මැතිතුමා.**

2022 අයවැය ප්‍රතිපාදන මගින් සංවර්ධනය කිරීමට යෝජිත අහල්ල දික්ගොඩහේන මාර්ගය යෝජනා කර තිබුණත් දැනට එය මිනුම් කටයුතු සඳහා යොමු කර ඇති බැවින් ඒ වෙනුවට මිද්දෙනිය

උතුර 5 වන පටුමගෙහි වලස්මුල්ලෙ ගෙදර බාල මහතාගේ නිවස අසළින් පිහිටා ඇති මුකලන්හේන මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී. එම මාර්ගය සකස් කිරීම ඉතා වටිනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

එය සංශෝධනය කරලා දෙන්නම්. ඉක්මණින් මේ සංවර්ධන කටයුතු සිදු කරන්න.

ඒ අනුව 2022 අයවැය ප්‍රතිපාදන මගින් සංවර්ධනය කිරීමට යෝජිත හෙල්ලල දික්ගොඩහේන මාර්ගය දැනට මිනුම් කටයුතු සඳහා යොමු කර ඇති බැවින් ඒ වෙනුවට මිද්දෙනිය උතුර 5 වන පටුමගෙහි වලස්මුල්ලෙ ගෙදර බාල මහතාගේ නිවස අසළින් පිහිටා ඇති මුකලන්හේන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජනාව සංශෝධනය කිරීම සුදුසු බවත් වෙන් කර ඇති ප්‍රතිපාදනයන්ට යටත්ව ඇස්තමේන්තු සකස් කර එය සංවර්ධනය කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-14. ගල්පොකුකන්ද පෙර පාසල් ගොඩනැගිල්ලෙන් ඉවත් කළ ලී දඬු ලබා ගැනීම සම්බන්ධව</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ගල්පොකුකන්ද පෙර පාසල් ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද ලී දඬු ලබා ගැනීම සම්බන්ධවයි මැයෙන් වතුකන්ද පුරාණ විහාරයේ විහාරාධිපති වතුකන්දේ ධම්මාරාම ස්වාමීන් වහන්සේ විසින් 2022.02.15 දිනැතිව ඉල්ලුම් කර ඇති පරිදි එම ගොඩනැගිල්ලෙන් ඉවත කරන ලද ලී දඬු තාක්ෂණික නිලධාරී වාර්තාවක් මත වතුකන්ද පුරාණ විහාරයේ අවශ්‍යතාවය සඳහා ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමා.</u>

සභාපතිතුමණි, ඒත් එක්කම අපේ මානෙල් මන්ත්‍රීතුමියගේ මාර්ග සංවර්ධනයේදී ඉවත් කරන ලද කැට ගල් ටිකක් වතුකන්ද පන්සලට දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. මේ ඉවත් කරල දේවල් නිකන් දිරාපත් වෙනවට වඩා ප්‍රයෝජනයක් ගන්න පුළුවන් තැනකට දෙන එක හොඳයි.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

කැට ගල් ටිකක් කිරම රෝහලට ලබා දුන්නා. තව තියෙනවා නම් බලලා දෙන්නම්.

ඒ අනුව ගල්පොකුකන්ද පෙර පාසල් ගොඩනැගිල්ලෙන් ඉවත කරන ලද ලී දඬු තාක්ෂණික නිලධාරී වාර්තාවක් මත වතුකන්ද පුරාණ විහාරයේ අවශ්‍යතාවය සඳහා ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-15. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම රමණී හල්පෙගමගේ මැතිතුමිය</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. රමණී හල්පෙගමගේ මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ජේ.පී.නිශාන්ත කුමාර මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-16. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිශ්චන්ද්‍ර මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-17. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම අයි.කේ.සුසන්ත පද්මතිලක් මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. අයි.කේ.සුසන්ත පද්ම තිලක් මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් කුමාර ගරුසිංහ මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-18. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම පී.එන්.එස්.ගුණවර්ධන මැතිතුමිය**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-19. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම එච්.කේ.ජී. ආනන්ද කුලසුන්දර මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. එච්.කේ.ජී. ආනන්ද කුලසුන්දර මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-20. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා**
**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-21. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ටී.බී. ඉන්දික මැතිතුමා ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ටී.බී. ඉන්දික මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 09.පුගතිය සාකච්ඡා කිරීම

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමණි, සියලු දෙනාගෙන්ම අවසරයි. අපි කිරම බස් නැවතුම්පොළ කඩ කාමර සම්බන්ධයෙන් කථා කළා. ඒ ගැන සියලු දෙනාටම යම් අදහසක් තියෙනවා. ඒත් එක්කම තවත් කඩ කාමර තුනක් සකස් කරන්න ඇස්තමේන්තු සකස් කරලා තිබුණා. පසුගිය දිනවල පොළ භූමියේ නව කඩ කාමරයක් සදහා කොන්ක්‍රීට් කණු ඉදි කරලා තිබුණා. ඒ සම්බන්ධයෙන් මට අදහසක් හැහැ.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

එම ස්ථානය ජංගම මත්ස්‍ය අලෙවිසැළක් සඳහා තමයි ඉදි කරන්නෙ . මම ඒ පිළිබඳ ගිය සභාවේ දීර්ඝ ලෙස කථා කරලා අපි අනුමැතිය ලබා ගත්තා.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා**

ඒත් එක්කම රදනිආර පාලම සම්බන්ධයෙන් සහ එහි අවධානම සම්බන්ධයෙන් මෙ සභාවේ දිගින් දිගටම අවස්ථා කිහිපයකදී කථා කළා. එම පාලම කඩා ගෙන ගියොත් ප්‍රධාන පාරක් නිසා ලොකු අවදානම් තත්වයක් ඇති වෙනවා. ඒ ගැන අවධානය යොමු නොකර සිටියොත් එහි දෝෂාරෝපණය සභාවටත් යොමු වෙනවා. ඒ සදහා කඩිනම් විසඳුමක් සිදුකරන්න ඕන.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෙම ස්ථානය තාක්ෂණ නිළධාරි මහතා බලන්න ගියා. මම ඒ ගැන අහන්නම්. අපිට වැලි කොට්ට කිහිපයක් ගහලා තාවකාලිකව විසඳුමක් කර ගන්න පුළුවන් වෙයි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුගත් සරඹගේ මැතිතුමා**

අපි මුලින් මෙ සඳහා පස් කොට්ට දාන්න යෝජනා කළා. නමුත් දැන් තියන තත්වය අනුව ඒ කිසිම විසඳුමක් හරියන එකක් නැහැ. පැති පැමමක්ම සකස් කරන්න වෙයි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මම ඉක්මණින් තාක්ෂණ නිළධාරි මහතාට බලන්න කියන්නම්.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.රාජපක්ෂ මැතිතුමිය**

ගරු සභාපතිතුමණි, ආඳුඵගොඩ මැල්ලකැටිගොඩ මාර්ගය පිළිබඳ මම නිතර මතක් කරනවා. දැනට වසර දෙකක පමණ සිට මේ ගැන කියනවා. අපේ හරිස්චන්ද්‍ර මන්ත්‍රීතුමන් ඇතුළු කිහිප දෙනෙක්ම මේ ගැන කථා කළා. මම ලිඛිතවත් ඉල්ලීමක් කළා. ප්‍රධාන පාරේ සිට මීටර් 50ක් පමණ දුරින් විශාල ලෙස වළවල් හැදිලා. ඊයෙ රාත්‍රියෙත් දෙදෙනෙක් වැටිලා තුවාල වෙලා. මිනිසුන්ට වලස්මුල්ලට යන කෙටිම මාර්ගය නිසා මෙක සකස් කර දීම ඉතා වටිනවා.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මම පසුගිය දින වලත් JCB යන්ත්‍රය යවලා ඔය ස්ථානය කපලා කාණුව ශුද්ධ කළා .ඒත් එහා පැත්තේ ඉඩම හිමියන් එය වහනවා. ඒක තමයි ගැටළුව. ඉක්මණින් කරන්න පුළුවන් දෙයක් බලන්නම්.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි පසුගිය දිනක සුගත් සරඹගේ මන්ත්‍රීතුමන්ගේ පාරක් බලන්න ගිය වෙලාවේ ඔය ස්ථානයෙන් එද්දි එම ස්ථානයත් බැලුවා. ඕතන වතුර බහින්න තියන කොටස වහන නිසා තමයි ප්‍රශ්නය එන්නේ. එතන ඉඩම අයිත දිගේ කාණුව කපලා ප්‍රධාන පාරෙන් වතුර බස්සන්න පුළුවන් නම් මෙය සාර්ථක වෙයි කියලා හිතෙනවා. මේ සඳහා කුමක් හෝ කරන්න අවශ්‍යයි.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

නමුත් ප්‍රධාන පාර උසයි . ඔය ස්ථානයේ බෝක්කුවක් තියෙනවා. එය පාදන්න තමයි තියෙන්නේ. අපි බලමු විසඳුමක් ලබා දෙන්න.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.ඒ.එස්.වීරසිරි මැතිතුමිය</u>

ගරු සභාපතිතුමණි, දැනට විදි ලාම්පු වැඩසටහන ක්‍රියාත්මක වෙනවද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

දැනට නතර කරලා තියෙන්නේ. ගරු ආණ්ඩුකාර තුමන්ගේ උපදෙස් පරිදි විදි ලාම්පු අක්‍රිය කරලත් තියෙනවා. අපේ ගරු ප්‍රා.ස.ම. චන්ද්‍රසේන මැතිතුමත් කිව්වා හිවය ඉදිරිපිට තියන විදි ලාම්පු අක්‍රිය කරන්න කියලා. සියලු දෙනාම එහෙම කරනවා නම් හොදයි.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්.ඒ.එස්.වීරසිරි මැතිතුමිය</u>

ඒත් එක්කම මම කිහිප වතාවක් කථා කළ කෝන්කර හේන සෞඛ්‍ය මධ්‍යස්ථානය අසළ මාර්ගය සකස්කිරීම පිළිබඳ අපේ ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත මැතිතුමා කිව්වා එය ඇස්තමේන්තු හදන්න දාලා කියලා. මම ඒ ගැන දැනගන්න කැමතියි කොහෙන්ද ඇස්තමේන්තු හදන්නේ කියලා.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ටී.ශාන්ත මැතිතුමා</u>

අපි ලක්ෂ 30 ව්‍යාපෘතිය මගින් මේ මාර්ගය සකස්කරන්න දාලා තියෙන්නේ. ඉදිරියේදි ඒ වැඩසටහන කෙරෙයිද දන්නෙ නැහැ.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඒ වැඩසටහන ඉදිරියේදි කෙරෙන එකක් නැහැ. ඔබ තුමිය ඔය පාර ගැන නිතරම කථා කරනවා. අපි සභාවෙන් කරන්න පුළුවන් දෙයක් කරලා දෙන්නම්. මම තාක්ෂණ නිළධාරි මහතාට බලන්න කියන්නම්.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අපි ඉල්ලුම් කරන ලද සියලු දේ මෙතෙක් පැහැර හැරියෙ නැහැ. නමුත් මේ දිනවල හිඟුරකන්ද , ගොමඩිය , අළුපොත්දෙනිය මාර්ග වල පය කඩන් වැටිලා ගමන් කරන්න බැහැ. අනුරු මාර්ග වල තත්වයත් එසේමයි . ඒත් එක්කම හිඟුරකන්ද විහාරස්ථානය අසළින් දණේකන්ද මාර්ගය බොක්කුව කැඩී යන නිසින් පාරේ වාහන ගමන් කරන්නට බැහැ

බැරි තත්වයක් පසුගිය දිනක ඇතිවුණා. විශාල පිරිසක් ගමන් කරන මාර්ගයක්. මේ බෝක්කුව සකස් කරලා දෙනවා නම් ඉතා ප්‍රයෝජනවත් වෙනවා. ඒත් එක්කම ගරු සභාපතිතුමණි, සියරපිටිය කොට්ඨාශයට බැකෝ යන්ත්‍රය ලබා දෙන්න පුළුවන් නම් දෙන්න කියන ඉල්ලීමත් මේ සමගම කරනවා.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිට පසුගිය දිනවල ඉතාම අඩු ඩීසල් ප්‍රමාණයක් තමයි ලැබුණේ. තෙල් ප්‍රශ්නය විසඳුන ගමන් එය කරලා දෙන්නම්. ඔබතුමාගේ කොට්ඨාශයට වෙන්වුණ සිලින්ඩර් අරගෙන ගිහින් මෙම ස්ථානයට සිලින්ඩර් යොදලා බෝක්කුව තාවකාලිකව හදන්න. පසුව පැති බැම්මක් හදමු. මේ දිනවල තියන මූල්‍යමය ප්‍රශ්න එක්ක බලන්න ඕන කරන්න පුළුවන් මොනවද කියලා. දැනට සිලින්ඩර් දාලා සකස් කරන්න.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මම නියෝජ්‍ය මන්ත්‍රීතුමන් කියූ කථාවට ඌණ පූර්ණයක් කරන්නම්. ඔය කියන ස්ථානය ගම්මාන කිහිපයක් යා වෙන පාරක්. කාලයක් තිස්සේ පෞද්ගලික ඉඩම් හිමියන් නිසා පාර කපන්න බැරිව තිබ්බා. දැනට පාර හොඳට කපලා තියෙනවා. නමුත් පසුගිය දිනවල වර්ෂාවත් එක්ක පස් කඩා වැටිලා යන්න බැරි මට්ටමටම. ලොරියක් වැටිලා කියන ආරංචියට මමත් එතනට ආවා. එම ස්ථානය වහන්න විශාල පස් ගොඩක් අවශ්‍ය වෙනවා. ඒවා අපිට ඉඩම් වලින් ගන්න පුළුවන්. මෙතන තෙල් නැති ප්‍රශ්නය මත මෙය නොකර ඉන්න අවශ්‍ය නැහැ. මොකද මේක අත්‍යවශ්‍යයි. දැනට සිලින්ඩර් මේ සභාවේ ගෙනත් තියෙනවා. සභාවේ වාහනත් තියෙනවා. සභාවේ වාහන වලින් කරන්න බැරි නම් මම වාහන සපයන්නම්. කෙසේ වෙතත් සිලින්ඩර් යොදන්න මිනිසුන්ට බැහැ. සිලින්ඩර් දාන්න මැෂින් එක අවශ්‍යයි. තෙල් ටිකක් සපයා ගෙන ඒ වැඩේ කරමු. ළමයි පාසල් යන්නේ මේ මාර්ගයෙන් . මිනිස්සු දාන මානාදිය රැගෙන පන්සලට යන්නේ මෙතනින්. මේක සකස් කරදීම විශාල පුණ්‍ය කර්මයක්. අපේ නියෝජ්‍ය මන්ත්‍රීතුමන් ඉන්නෙත් මේ ආසන්නයේ. මිනිසුන්ගෙන් එතුමාටත් යම් යම් දෝෂාරෝපණ එනවා. එතුමාටත් මේ ගැටළු වලට මුහුණපාන්න වෙනවා. අපි දෙදෙනා එකතු වී සියලු පහසුකම් සපයන්නම්. එක් දිනකට මැෂින් එකත් , සිලින්ඩර් ටිකත් නිදහස් කරලා දෙන්න.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

එහෙම නම් ඔබතුමන්ලා දෙදෙනා කථා කරලා ලබන සතියේ දිනයක් තීරණය කරලා කියන්න. අපි තෙල් ටිකත් සපයා ගෙන සිලින්ඩර් ටික සභාවේ ටිපර් එකෙත් ගෙනත් JCB එකෙන් සිලින්ඩර් ටික දාලා සකස් කරලා දෙන්නම්. මෙතනට සිලින්ඩර් පේළි දෙකක් දාන්න. ඒක ලබන සතිය ඇතුළත අනිවාර්යයෙන්ම සිදු කරවන්නම්. එතකොට ප්‍රශ්ණය තාවකාලිකව විසඳේවි.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා</u>**

අපි සිලින්ඩර් පේළි දෙකක් දාලා පසුව පැති බැම්මක් සකස් කරන්න බැරි වුණොත් මිනිසුන් ලවා ගල් බැම්මක් සකස් කරමු. ඒකත් අපිට කරන්න පුළුවන්.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී සිරිසේන හෙට්ටිගේ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, දෙහිගහහේන ආයුර්වේද මධ්‍යස්ථානයට පිවිසෙන මාර්ගය සකස් කර ගැනීමට අවශ්‍යයි. රෝගියෙක් එම ස්ථානයට ගෙන යෑමේදී අපහසුතාවයක් ඇති වන නිසා. දැනට විශාල ප්‍රමාණයක් මිනිස්සු බෙහෙත් ගන්න ඒ ස්ථානයට එනවා. එය මුලින් ආරම්භ කරපු අයටත් කාලයකින් පසුව දැනට නැවත ආරම්භ කිරීමට අනුමැතිය දුන් ඔබතුමන්ලා සියලු දෙනාටම ස්තූති වන්න වෙනවා. ඉතිරි අඩුපාඩු ටිකත් සකස් කරලා දෙන්න කියලා ඉල්ලීම කරනවා.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි ගිය සභාවේ ඒ සම්බන්ධව යෝජනාවක් ස්ථිර කර ගත්තා. එහි අඩුපාඩු ටික ඉදිරියේදී සකස් කරමු.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ඒ. ගාමිණී මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මිද්දෙනිය උතුර ජල පොම්පාගාරයට උඩු පැත්තේ මඩ වළක් තියෙනවා. එතන පස් ටිකක් දාලා සකස් කරන්න අවශ්‍යයි.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

වර්ෂාව අඩු වෙනකම් ඉදලා තමයි ඒ වැඩේ කරන්න වෙන්නේ. නැත්නම් තේරුමක් නැහැ.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මේ සම්බන්ධව කථා කළොත් හැමතැනම ගැටළු ඇතිවෙලා තියෙන්නේ අල්ලපු ඉඩමෙන් වතුර බස්සන්න දෙන්නෙ නැතිව හෝ කාණුව කපන්න දෙන්නේ නැතිව අවහිර කිරීමෙන්. ඔමත් මගේ ගෙදර ළග ප්‍රශ්නයක් වසර හතරක් තිස්සේ කියනවා. නමුත් විසඳුමක් නැහැ. ඔය ගාමිණී මන්ත්‍රීතුමන් කියන ප්‍රශ්නයටත් පස් දාලා කලලා ඒ මඩ වළ තාවකාලිකව වහන්න පුළුවන්. නමුත් විසඳුමක් ලැබෙන්නේ නැහැ. කිසිම කෙනෙකුට තමන්ගේ ඉඩම කියලා වතුර බහින මාර්ගය අවහිර කරන්න බැහැ. එහෙම වුණාම තමයි එතන මඩවළ හැදෙන්නේ. කටුවන පාසල ළගත් ඔය වගේ ස්ථානයක් තියෙනවා. මේ වගේ කටයුතු සම්බන්දයෙන් මට නඩු පවා වැටිලා තියෙනවා. නඩු පස්සේ වැටුණත් මේ ගැටළු වලට අපි ස්ථිර විසඳුමක් ලබා දෙන්න ඕන. පස් දාලා මඩ වළ වහනවා නම් වතුර බැහැල යන්න ක්‍රමයක් සකස් කරන්න ඕන. ජනතාවට අවශ්‍ය විසඳුම ලබා දෙන්න ඕන.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.පී.සී කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මාර්ග වල විදි ලාම්පු ක්‍රියා විරහිත කරමින් අපි විදුලිය ඉතිරි කිරීමෙ කටයුත්තට දායකත්වය ලබා දුන්නා. නමුත් තවමත් අතුරු මාර්ග වල විදි පහන් අක්‍රිය කරලා නැහැ. ඒ සදහා ක්‍රියාමාර්ගයක් ගන්නවා නම් හොදයි.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා</u>**

ගරු සභාපතිතුමණි, මගේ නිවස ළග විදි ලාම්පුව අක්‍රිය කිරීම ගැටළුවක් නැහැ. නමුත් එය නැවත දැල්වීමට සලස්වනවා නම් එය පෞද්ගලික මුදලින් බිල ගෙවන බව මම මතක් කර සිටිනවා.

**<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ජී. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමන් ඇතුළු සියලූ දෙනාගෙන්ම අවසරයි. පසුගිය දිනක සිදු වූ මාගේ පියාගේ අභාවය වෙනුවෙන් ගරු සභාපතිතුමන් , උප සභාපති තුමන් වගේම සියලුම මන්ත්‍රී මණ්ඩලයද , කටුවන ප්‍රාදේශිය සභාවේ ලේකම්තුමා ඇතුළු සියලු නිළධාරින් සහ සේවක මණ්ඩලයද සිදුකළ කැපවීම පිළිබද ස්තුතිය පළ කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.

ඒත් එක්කම අනෙක් කාරණය විදියට මම මේ රටේ පවතින තත්වයත් සමග මාගේ පෞද්ගලික අදහසක් ඉදිරිපත් කිරීමට කැමතියි. මහජන මුදලින් මම ගනු ලබන දිමනාවන් සහ මහා සභා දිනයේදි මට හිමි කෑම වෙල් මින් ඉදිරියට නොගන්නා මම තීරණය කළා. ඒ අනුව ලබන මස සිට මාගේ මන්ත්‍රී දීමනාව මම ලබා නොගන්නා බවත් අද දින සිටම උදේ සහ දිවා ආහාර වේල් මම නොගන්නා බවත් ප්‍රකාශ කර සිටිනවා. ආහාර ලබා නොගැනීම සම්බන්ධව මම අවස්ථා කිහිපයකදීම කථා කළා . නමුත් අද මම පෞද්ගලික තීරණයක් ලෙස මෙය ඉදිරිපත් කරනවා. මෙම මුදල් මහජන සුභ සිද්ධිය සදහා එලදායි ලෙස යොදවන්න කියන ඉල්ලීම සිදු කරනවා.

ඒත් එක්කම මම විපක්ෂයටත් යෝජනාවක් කරනවා. පෙරේදා දිනයේදි මිද්දෙනිය නගරය තුළ කිසිම කෙනෙකුට ගමන් කරන්න නොහැකි තත්වයක් උදාකළා. පාසල් ඇරලා ළමයින්ට ගෙදර යන්න විදියක් නැති වුණා. මාර්ග අවහිර කරමින් ජනතාව දැඩි අපහසුතාවයට පත් කළා. මිද්දෙනිය ඇඟලුම් කර්මාන්ත ශාලාවට බස් රථ එන එක වැළැක්වුවා. මේ පිටුපස සිටියේ විපක්ෂයේ ප්‍රභල සාමාජිකයින්. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා එවැනි ලෙස ජනතාව අපහසුතාවයන්ට පත් කරන්න එපා කියලා.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මන්ත්‍රීතුමා ඔබතුමන්ගේ මාසික දීමනාව මාස තුනක් මිද්දෙනිය පුරාණ විහාරස්ථානයේ ජල බිල් හිගය පියවීමට යොදවන්න කියලා ඔබතුමාගේ ඉල්ලීමක් තිබුණා. එම මාස තුනක දීමනාව යෙදවූ

පසු ඉතිරි මාස වල දීමනා කුමන එලදායි කටයුත්තකට යොදවන්නේද යන්න ඔබතුමන් තීරණය කරලා අපිට කියන්න.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මේ අවස්ථාව වන විට රට තුළ විශාල අර්බුධයක් තියෙනවා. එය පක්ෂ භේදයකින් තොරව සිදුවන දෙයක්. මේ ජනතාවට දැනෙන ප්‍රශ්නයක් සඳහා ජනතාව පාරට බැහැලා තියෙනවා. අපි පිටුපසින් ඉඳන් මෙහෙයවන දෙයක් නෙවෙයි. අපි විපක්ෂයක් විදියට කරන දේවල් කොහොමත් කරනවා. මිනිස්සු පාරට බැහැලා යම යම් දේවල් කරනවා. ඒ මිනිසුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු හොයනවා. මේ සඳහා කාටවත් චෝදනා කරලා වැඩක් නැහැ. මේ තත්වය තේරුම් අරගෙන කටයුතු කිරීම තමයි අවශ්‍ය වෙන්නේ.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුගත් සරම්ගේ මැතිතුමා**

ගරු සභාපතිතුමණි, ඉදිරියේදී සමස්තයක් ලෙස අපි මුලා අර්බුධයක සිටිනවා. අපි පොඩි කාලේ ආයුර්වේද බෙහෙත් දීලා තමයි අපේ දෙමව්පියන් අපිව හදාගත්තෙ. සිරිසේන හෙට්ටිගේ මැතිතුමන් ආයුර්වේද බෙහෙත් ගැන කථා කළා. මේ යන තත්වයත් එක්ක ඉදිරියේදී බටහිර වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමේදී යම් යම් ගැටළු ඇති වේවි. ඒ නිසා මේ ආර්ථික තත්වය තුළ අපි ආයුර්වේද වෛද්‍යවරුන් සමඟ කථා කරලා කොට්ඨාශ මට්ටමින් දැනුවත් කරලා ආයුර්වේද බෙහෙත් සඳහා ජනතාව නැඹුරු කිරීමට අවශ්‍ය කටයුතු කරමු.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමණි. මේ දිනවල රට තුළ විශාල අර්බුධයක් නිර්මාණය වෙලා තියෙනවා. ගෝඨා ගෝ හෝම් කියන තේමාවක් කරගෙන සියලු දෙනාම යම් අරගලයක් කරනවා. ගෑස් , ආහාර, ඉන්ධන ආදී සියලු දේ හිඟ වීම තුලින් මිනිස්සු යම් අර්බුධයකට මුහුණ දීලා තියෙනවා. නමුත් අපි 88-89 යුගයක් නැවත නිර්මාණය කරන්න අවශ්‍ය නැහැ. ආණ්ඩුවේ අක්‍රමිකතාවයක් ඇත්නම් එයට කරන්න ඕන ප්‍රජාතන්ත්‍රවාදය තුලින් යම් විසඳුමක් ලබා ගැනීමයි. එහෙම නැතිව මාර්ග හරස් කරලා , ගස් කපා දාලා ප්‍රචණ්ඩකාරී තත්වයක් තුළ මෙයට විසඳුම් හොයන්න බැහැ. මෙතන හදිසි රෝගියෙක් නම් ගෙනියන්න බැරිව මැරෙන්න පුළුවන්. ඒ නිසා රටේ ප්‍රශ්ණයක් නම් අපි ප්‍රජාතන්ත්‍රවාදය තුලින් සාමකාමී විසඳුම් හොයමු. අපි සාමකාමී ලෙස උද්ඝෝෂණ කරමු. ප්‍රචණ්ඩත්වය තුලින් පීඩාවට පත් වෙන්නේ අසරණ මිනිසුන් . මෙය වැරදි පූර්වාදර්ශයක් වෙන්න පුළුවන්. ඒ නිසා අපි ප්‍රචණ්ඩත්වයට ඉඩ නොදෙමු. ස්තුතියි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

සියලු දෙනාම විවිධ යෝජනා විවිධ අදහස් ඉදිරිපත් කළා. මේ රටේ පවතින තත්වය පිළිබඳව බොහෝ දෙනාට යම් යම් අදහස් තියෙනවා. ඒත් එක්කම කියන්න ඕන දෙයක් තමයි මේ අවස්ථාවේ යම් යම් පාර්ශවයන් පෞද්ගලික අමනාප නම් හේතු කරගෙන පෞද්ගලික පළි ගැනීම වල නිරත වෙනවා. ඒක විය යුතු දෙයක් නොවෙයි. තමන්ගේ අයිතිවාසිකම් සඳහා සාමකාමී ලෙස උද්ඝෝෂණ කිරීමෙ ගැටළුවක් නැහැ. පසුගිය කාලයේ ගුරු වැටුප් සඳහා සාමකාමී උද්ඝෝෂණ තිබුණා. අපේ එම්.ඩී.සුගතදාස මන්ත්‍රීතුමන්ලා කිරම හංදියේ සාමකාමී ලෙස රටේ පවතින අර්බුධය සම්බන්ධව උද්ඝෝෂණ පැවැත්වුවා. ඒවායේ ගැටළුවක් නැහැ. ඒවායේ දේපල හානි නැහැ. මේ ළඟදී මිද්දෙනිය නගරයේ තිබුණ උද්ඝෝෂණය ඊට වඩා දරුණු අතට හැරුණා. යම් අනවසර ඉදිකිරීමක් , ගොඩනැගිමක් සඳහා සභාවක් විදියට නීතිය ඉෂ්ඨ කරන්න අපිට සිදුවෙනවා. ඒක පෞද්ගලික තරහක් කර ගෙන මෙවැනි අවස්ථාවල පලිගැනීම් කිරීම සුදුසු නැහැ. මේ රටේ තත්වය තුළ ප්‍රචණ්ඩත්වය සිදු කිරීම , දේපල හානි කිරීම උචිත නැහැ. ලොකු අර්බුධයක් නිර්මාණය වෙලා තිබුණත් දැනට එය යම් තාක් දුරට සමනය වෙලා තියෙනවා. එහෙම වෙලා මේ රට සමතයකට පත්වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. සියලු දෙනාගෙන්ම ඉල්ලුම් කරන්නෙ මේ රට තුළ පොදු දේපල ආරක්ෂා කරමින් , ප්‍රචණ්ඩත්වයෙන් තොරව සාමකාමීව උද්ඝෝෂණ කරමින් තම ඉල්ලීම දිනාගන්න. මේ වෙලාවේ ආරක්ෂක අංශය රටේ පොදු දේපල ආරක්ෂා කරන්න විශාල වෙහෙසක් වෙනවා. ඒ අයත් මතක් කරන්න ඕන.

ඒත් එක්කම අපි අද දින කථා කරන ලද සංවර්ධන කටයුතු පවතින මූල්‍ය තත්වයන් පිළිබඳ සළකා බලලා කරන්න පුළුවන් හැම සංවර්ධන කටයුත්තක්ම කරන්නම්. රටේ විදුලි අර්බුධය විසඳීමෙන් පසුව විදි පහන් ආදිය නිසි පරිදි යථා තත්වයට පත් කරන්න කටයුතු කරන්නම්.

**10. - ස්තූතිය හා නිමාව.**

අද දින 2022 වර්ෂයේ අප්‍රේල් මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වූන අපේ ගරු උප සභාපතිතුමන්, හිටපු ගරු සභාපතිතුමන් දෙපළ , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා, නිළධාරිතුමිය, මාධ්‍යවේදී තුමන් , අද දින මහ සභාව පැවැත්වීමට අපට සහාය දුන් මිද්දෙනිය පොලිස් ස්ථානාධිපතිතුමන් , ජ්‍යෙෂ්ඨ පොලිස් ස්ථානාධිපතිතුමන්, සියලු පොලිස් නිළධාරින් ඇතුළු සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අද දවසේ සභාවෙ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා විසින් සඳහන් කරන ලද අතර අනතුරුව සභාවේ කටයුතු නිමා කරන ලදී.

ප.ව 02.00 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

......................

අයි. ජී. මහින්ද,

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.